
Sampajanna

# මෛත්‍රී ගංගා



මහෝපාධ්‍ය, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, ශාසනධජ, මහා කම්මට්ඨානාචාර්ය
අතිපූජනීය නාඋයනේ අරියධම්ම මහා නායක ස්වාමීන් වහන්සේගේ
73 වන ජන්ම දිනය නිමිත්තෙන් දීර්ඝායුෂ පතා
නාඋයන ආරණ්‍ය ශාසනාරක්ෂක ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතිය
අනුග්‍රහයෙන් පිදෙන දහම් පඬුරකි.

දේශකයාණන් වහන්සේ
**මහෝපාධ්‍ය, ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය, ශාසනධජ, මහා කම්මට්ඨානාචාර්ය**
**අතිපූජනීය නාඋයනේ අරියධම්ම මහා නායක ස්වාමීන් වහන්සේ**

Sampajanna

# මෛත්‍රී ගංගා

දේශකයාණන් වහන්සේ
මහෝපාධ්‍ය ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය
ශාසනධජ මහා කම්මට්ඨානාචාර්ය
අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම මහා නායක ස්වාමීන් වහන්සේ

Sampajanna

# පෙර වදන

නිධීනංව පවත්තාරං යංපසේස වජ්ජදස්සනං නිගගසහවාදිං මෙදිනං තාදිසං පණ්ඩිතං භජේ තාදිසං භජමානසස සෙයෙහා හොති න පාපියොති.

වරදෙහි දොස් දකිමින් නිධානයක් පෙන්වා දෙන්නාක් මෙන් වරද පෙන්වා දෙන්නාවූද ගුණ ගරුක උතුමන් වහන්සේලා ඇසුරු කළ යුතුය. එවැනි උතුමන් ඇසුරු කිරීමෙන් යහපතක්ම මිස අයහපතක් නොවේ.

අතිපූජනීය ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය ශාසනධජ, මහා කම්මට්ඨානාචාර්ය මහෝපාධ්‍යාය නාඋයනේ අරියධම්ම මහා ස්වාමීන් වහන්සේගේ 73 වන ජන්ම දිනය සැමරීම වෙනුවෙනුත් මාහිමිපාණන් වහන්සේට නිරෝගී සුවයත් දීර්ඝායුෂත් අත්වේවායි පැතුමෙනුත් මෙම දහම් පොත් නාඋයන ආරණ්‍ය සේනාසන දායක සභාව මගින් මුද්‍රණය කොට නොමිලයේ බෙදා දෙන බැවින්, එය මනාව කියවා ඔබගේ කුසල් සිත මාහිමිපාණන් වහන්සේ වෙත යොමු කොට ආශිර්වාද පවත්වන මෙන් දන්වා සිටිනුයේ මෛත්‍රියෙනි.

ගුණ ධර්ම මාර්ගය පෙන්වා දෙන උතුමන් වහන්සේලා අතර ශ්‍රේෂ්ඨතම උතුමන් වහන්සේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේයි. සත්වයන්ට හිතසුව පිණිස, දුක සංසිඳුවීම පිණිස, නිවන අවබෝධ කරවාලීම පිණිස බොහෝ සෙයින් වරදෙහි දොස් පෙන්වමින් වරදට නිග්‍රහ කොට සංවේගය උපදවාලමින් නිවන් මග පෙන්වා දී වදාරන හෙයින් ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා ඇසුර සැමකල්හි අවබෝධය පිණිස පවතී.

වක්කලී ස්වාමීන් වහන්සේ පෝටල ස්වාමීන් වහන්සේ වැනි අයට කළ නිග්‍රහය හේතුවෙන් සංවේගය උපදවා භාවනා කොට උතුම් අර්හත්වය ලබා ගැනීමට හේතුවිය.

සර්වඥයන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය අනුගමනය කරන සත්පුරුෂ ගුණධර්ම පෝෂණය කරගත් උතුමන් වහන්සේලාගේද මෙම පණ්ඩිත ගුණය පිහිටයි. එවැනි උතුමන් වහන්සේලා අතර ධර්ම සේනාධිපති සාරිපුත්ත මහරහතන් වහන්සේ සුවිශේෂී වේ. මහා සංඝරත්නයට නිරතුරු අවවාද අනුශාසනා පවත්වන අතර සංවේග පමුණුවමින් ධර්ම දේශනා ද පවත්වයි. අනුශාසනාද පවත්වයි. අවවාදද

කරයි. මෙම හේතුව නිසා බොහෝ භික්ෂූන් වහන්සේලා සංවේගය උපදවා භාවනා වඩයි. අප්‍රමාදීව ගුණධර්ම පෝෂණය කරයි. මෙසේ අප්‍රමාදීව ගුණධර්ම පෝෂණය කරන්නාවූ භික්ෂූන් වහන්සේලා අතර බොහෝ නමක් මගඵල නිවන සාක්ෂාත් කරගනිති. මේ කාරණය මනාව දන්නාවූ තථාගතයන් වහන්සේ දිනක් දම්සභා මණ්ඩපයට වැඩම කොට සාරිපුත්ත මහරහතන් වහන්සේගේ ගුණ දේශනා කොට එවැනි උතුමන් වහන්සේලා ඇසුරෙන් නුඹලාට යහපතක් මිස අයහපතක් නොවන බව දේශනා කොට වදාළ හෙයින් බොහෝ භික්ෂූන් වහන්සේලා එයින් සංවේගය උපදවා මගඵල නිවන සාක්ෂාත් කරගන්නා ලදී.

කැලයක නොයෙකුත් ගස් වර්ග වෙති. එනමුත් සුවඳ හමන හඳුන් වැනි ගස් වර්ග ඉතා දුර්ලභයි. වර්තමාන ජන සමාජය තුළද බොහෝ සත්පුරුෂයෝ වෙති. එනමුත් භාත්පස ගුණ පැතිරෙන සත්පුරුෂයෝ අල්ප වේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාල සත්පුරුෂ අය අතර වර්තමානයේ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමාධිපති අතිපූජනීය නා උයනේ අරියධම්ම මාහිමිපාණන් වහන්සේ අති ශ්‍රේෂ්ඨතම සත්පුරුෂ උතුමන් වහන්සේ නමකි. ධර්මය ම ජීවය කරගත් සියළුම ගුණ ධර්මයන්ගෙන් ජීවිතය පෝෂණය කරගත් මෙවැනි සත්පුරුෂ උතුමන් වහන්සේලා අති දුර්ලභ වේ. උප්පත්තියෙන් 73 වන ජන්ම දිනය සිහිපත් කරන අතිපූජනීය මාහිමිපාණන් වහන්සේට මෙම සත්පුරුෂ ගුණධර්ම තව තවත් දියුණු කරගනිමින් ජන සමාජයේ ලක්ෂ කෝටි ගණන් පිරිසට අවවාද අනුශාසනා පවත්වා නිරෝගී සුවයක් විංසත් සතවර්ෂාදික කාලයක් දීර්ඝායුෂත් අත්වේවායි පතනුයේ ඉමහත් ගුරු බැතියෙනි.

ගරු මාහිපාණන් වහන්සේගේ පුණ්‍ය පෙළහරේ උපකාරීව සිටින නාඋයන දායක සභාව මගින් මෙම පොත මුද්‍රණය කරවා නොමිලයේ බෙදා හරින හෙයින් එම දායක සභාවේ පිංවතුන්ටත් ධනය පරිත්‍යාග කළ පිංවතුන්ටත් මුද්‍රණය කළ පිංවතුන්ටත් උපකාරක සැමට මෙම පොත කියවන ඔබටත් දෙවියන් සහිත ලෝකවාසීන්ටත් මෙම මහඟු පුණ්‍ය කර්මය දෙලොව ජයගෙන නිවන් පිණිසම වේවා.

ධර්මකාමී ඔබ අප සැමට නිවන් අවබෝධය තෙක්ම සත්පුරුෂ ඇසුර ලැබේවා.

පූජනීය අඟුල්ගමුවේ
අරියනන්ද ස්වාමීන් වහන්සේ

Sampajanna

Sampajanna

# පුණ්‍යානුමෝදනාව

"දුල්ල තො' සප්පුරිස සංසේවෝ"

අති දීර්ඝ වූ සංසාරයේ ඉතාමත් කලාතුරකින් කල්ප ගණනකට වතාවක් අපට ලැබෙන වටිනාම සම්පත්තියකි කල්‍යාණ මිත්‍ර සම්පත්තිය. බුද්ධ ශාසනයේ පැවැත්ම සම්පූර්ණයෙන්ම පවතින්නේද කල්‍යාණ මිත්‍ර සම්පත්තිය මතයි.

වර්තමානයේ එලෙස ශාසනයේ උන්නතිය වෙනුවෙන් මුලු ජීවිතයම කැප කරමින් දෙව් මිනිසුන් සහිත සකල ලෝ වැසියනට අර්ථයෙන් ධර්මයෙන් අවවාද අනුශාසනා කරන අති පූජනීය නා උයනේ මහා ස්වාමීන් වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ සුපේසල ශික්ෂාකාමී බුද්ධ පුත්‍ර කල්‍යාණ මිත්‍ර සම්පත්තියකගේ ඇසුරට පත්වීම අප පෙර කරගත් විශාල පුණ්‍ය ශක්තියක ඵලයකි. සැබවින්ම අප වැනි ලෝ වැසි බොහෝ දෙනෙක් අද ධර්මයෙන් සැනසෙන්නේ පූජනීය ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනාවෙනුත් ආශිර්වාදයෙනුත් සහ ආදර්ශයෙනුත්ය.

මෛත්‍රියේ ප්‍රතිමූර්තියක් වූ පූජනීය නා උයනේ මා හිමියන්ගේ ශ්‍රී මුඛ දේශනාවක් වන මෛත්‍රී ගංගා දහම් පොත නැවත මුද්‍රණය කරන්නට අප සිතුවේ අද සමාජයට එය කාලීන අවශ්‍යතාවයක් වන නිසාත් විශේෂයෙන් පූජනීය නා උයනේ මාහිමිගේ 2012 අප්‍රේල් මස 24 දිනට යෙදෙන 73 වැනි ජන්ම දිනය වෙනුවෙන් කෘතවේදීව පින් අනුමෝදන් කර ආශිර්වාද කිරීමේ අපේක්ෂාවෙනුත්ය.

මේ වටිනා ධර්ම දානමය කුශල ශක්තියත්, අපගේ ජීවිත වටා අතීත සසර පටන් එකතු කරගත් සියළු කුශල සම්භාරයත් අනුමෝදන් කරවීමෙන්ද බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයේ සූවිසි මහා ගුණයේ අසීමිත ගුණ බලයෙන් සියළු දැහැමි ආරක්ෂාව ආශිර්වාදය ලබමින් නිරතුරුව කල්‍යාණ මිත්‍ර ඇසුරේ සියළු ශාසන හිතෛෂී දෙවියන්ගේ බඹුන්ගේ ද උදව් උපකාර මධ්‍යයේ පිංවත් අති

Sampajanna

ගෞරවණීය ගුරු දෙවෝත්තම නා උයනේ මාහිමාපාණන් වහන්සේට උතුම් ලොව්තුරා සම්මා සම්බුද්ධත්වය ලබන අවස්ථාව තෙක්ම සුගති ජීවිත ලබමින් නිදුක් නිරෝගීභාවය, දීර්ඝායු සම්පත් භුක්ති විඳිමින් කායික මානසික සැනසිල්ලේ සුවසේම පාරමී ධර්මයන් සපුරා ගැනීමට අවශ්‍ය ශක්තිය, ධෛර්ය, වාසනාව, අවකාශය ලැබේවායි ගෞරව භක්තියෙන් පාද නමස්කාර කර මෙත් සිතින් අපගේ හෘදයාංගම ආශිර්වාදය ගුරු බැතියෙන් පිරිනමන්නෙමු.

තවද නා උයනේ ආරණ්‍යය හුදුමහත් කටයුතු සොයා බලා ගිහි පැවිදි දෙපාර්ශවයට විශාල ශාසනික මෙහෙවරක් ඉටුකර දෙන අති පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමීන් වහන්සේත් පූජ්‍ය නා උයනේ මාහිමියන්ගේ සෙවණැල්ල මෙන් ළඟ ඉඳිමින් සියළු උපස්ථාන කටයුතු කරන පූජ්‍ය නාග පොකුණේ ආර්යසීල ස්වාමීන් වහන්සේටත් නා උයන ආරණ්‍යයේ වැඩ වසන සියළු ස්වාමීන් වහන්සේලාටත් යෝගාශ්‍රමවාසී ග්‍රාමවාසී, දේශීය, විදේශීය සියළු බුද්ධ පුත්‍රයන් වහන්සේලාට මේ පිරිහීගෙන යන ශාසනික ප්‍රතිපදාවන් නැවත නඟා සිටුවන්න අවශ්‍ය ශක්තිය, ධෛර්යය, වාසනාව, නිදුක් නිරෝගී භාවය දීර්ඝායු සම්පත් අභිවර්ධනය වේවා. සුවසේ පාරමී දම් සපුරා අමා මහ නිවනින් සැනසෙත්වා. මෙම පොත මුද්‍රණය කිරීමේදී නොයෙක් අයුරින් උපකාර කරන සී/ස පොල්පිතිගම සණස සමිති සංගමයේ සාමාන්‍යාධිකාරි ලේකම් එල්.යූ. බාලසූරිය මහතා ඇතුළු පවුලේ සැමටත් අපගේ සහෝදර සියළු දායක කාරකාදීන්හටත්, කැපකරු සේවක මණ්ඩලයේ සැමටත් මේ වටිනා ධර්ම දානමය පිංකම සඳහා නන් අයුරින් උපකාර කළ සැමටත් සියළු යහපත සෙත ශාන්තිය උදාවේවා. මේ ගම්, නගර, ලංකාව, දඹදිව, මේ සක්වල, අනන්ත සක්වල සැමටත් මේ උදාවූ කුසල බලයෙන්, නිදුක් නිරෝගීභාවයෙන් දීර්ඝායුෂ අභිවර්ධනය වීමෙන් ඉතා ඉක්මන් භවයකදීම අමා මහ නිවනින් සැනසෙත්වා!

නිවන් දක්නා තුරු කළණ මිතුරු ඇසුර සැලසේවා!

නා උයන ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතිය

දිනය: 2012 අප්‍රේල් 24

Sampajanna

# මෛත්‍රී ගංගා

**නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස//**
**බුද්ධො සො භගවා බොධාය ධම්මං දේසෙති**
**දන්තෝ සෝ භගවා දමථාය ධම්මං දෙසෙති**
**තිණ්ණොසො භගවා තරණාය ධම්මං දෙසෙති**
**මුත්තො සො භගවා මොචාය ධම්මං දෙසෙති**
**අස්සත්ථො සො භගවා අස්සාසාය ධම්මං දෙසෙති**
**පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙතිති.**

මහා සංඝ රත්නයෙන් අවසර...

ශ්‍රද්ධාවන්ත පින්වතුනි, තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අර්හත් වූ සම්‍යක් සම්බුද්ධ සර්වඥ රාජෝත්තමයන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කළා වූ බුද්ධානුස්සති භාවනාවට අදාල සූත්‍ර පාඨයක් මේ කියවුනේ.

බුද්ධො සො භගවා බොධාය ධම්මං දෙසෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේ තමන් බුද්ධත්වයට පැමිණ ලෝක සත්වයාටද චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිස ධර්මය දේශනා කරන සේක.

දන්තො සො භගවා දමථාය ධම්මං දෙසෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේ තමන් ඉන්ද්‍රිය දමනය කොටගෙන අන් අයටද ආත්ම දමනය ඉන්ද්‍රිය දමනය සඳහා ධර්ම දේශනා කරන සේක.

දන්තො සො භගවා සමථාය ධම්මං දෙසෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේ තමන් සංසිඳීගෙන අන් අයට ද සංසිඳීම සැනසුම පිණිස දහම් දෙසන සේක.

තිණ්ණොසො සො භගවා තරණාය ධම්මං දෙසෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේ තමන් සසර කතරින් එතෙරවී අන් අයටද එතෙර වීම සඳහා දහම් දෙසන සේක.

මුත්තෝ සො භගවා මොචාය ධම්මං දෙසෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේ සංසාර දුකින් අතමිදී අන් අයට ද දුකින් මිදීම සඳහා සදහම් දෙසන සේක.

අස්සත්ථො සො භගවා අස්සාසාය ධම්මං දෙසෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේ පරම අසල්වැසිල්ලට පැමිණ අන් අයට ද අස්වැසීමක් සැනසුමක් නිවීමක් සඳහා සදහම් දෙසන සේක.

පරිනිබ්බුතො සො භගවා පරිනිබ්බානාය ධම්මං දෙසෙති.

ඒ භාග්‍යවතුන් වහන්සේ බෝධිමූලයේ දී ක්ලේශ පරිනිර්වානය කොට අන් අයටද ක්ලේශ පරිනිර්වානය සදහා සදහම් දෙසන සේක. කියන එක මේ සූත්‍ර පාඨයේ කෙටි තේරුමයි.

මේ අවස්ථාවේ සිදුවීගෙන යන මේ පිංකමේ පරමාර්ථය. ඒ ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාවක් සම්පූර්ණ කිරීමයි. උන්වහන්සේ දේශනා කොට වදාළ ශ්‍රේෂ්ඨ අනුශාසනාව තමයි අර බෝධිප්‍රාර්ථනාවෙන් ප්‍රකාශ වන්නේ. මීට විසි අසංඛ්‍ය කල්ප ලක්‍ෂයකට පෙර මාතුපෝෂක කුමාර කාලයේ දී මහා සාගරයේ මෑණියන් කරපිට තියාගෙන හත් දවසක් පීනු ඒ මාතුපෝෂක

Sampajanna

කුමාරයන් වහන්සේගේ සිතේ පහළවූ ශ්‍රේෂ්ඨ අදහසක් මේ ප්‍රාර්ථනාවෙන් ප්‍රකාශ වෙනවා. සුද්ධාවාසවාසී බ්‍රහ්ම රාජයෙක් කල්ප ගණනාවක්ම නිරෝධ සමාපත්තියෙන් සිට ඉන් නැගීමේ නිරෝධ සුවය, නිවන් සුවය ලොවට බෙදා දෙන්නේ ලොව්තුරා බුදුවරයන් වහන්සේලා නේද. අන්න ඒ බුදුවරයන් වහන්සේලා දැන් මනුලොව ජීවත්ව ඉන්නවාද කියා දිවැසින් බැලුවා. ඒ කාලේ බුදුවරයන් වහන්සේලා නොසිටි බැවින් බෝධිසම්භාර පුරන බෝසතාණන් වහන්සේලා ඇද්දැයි විමසා බැලුවා. මේ අරහත්ත බ්‍රහ්ම රාජයාගේ දිවැසට පෙනුනේ සත් දවසක් මුළුල්ලේ මෑණියන් කරපිට තියාගෙන මහ සයුරේ පීනන මාතුපෝෂක කුමාරයා. දස මාසයක් කුසේ දරාගෙන ලේ කිරි කර පොවා හදා වඩා ගත් තමන්ගේ දයාබර මෑණියන්ට ජීවිත දානය කරමින් රෑ දවල් අතරක් නෑර මහත් වෙහෙසීමකින් ව්‍යායාමයකින් පීනන මේ පුතණුවන් දුටු කෙනෙහි අරහත්ත බ්‍රහ්මරාජයාට පුදුමාකාර අවබෝධයක් ඇති වුණා. මේ වාගේ කළගුණ දන්න, කළගුණ සලකන, කළ උපකාරයට ජීවිත පරිත්‍යාගයෙන් දිවිගෙවන සත් පුරුෂයන් හට ලොව්තුරා සම්බුද්ධ රාජ්‍ය ලබන්නට පුලුවනි. ඒ නිසා මේ දරුවාට බුද්ධත්වය සඳහා අවබෝධයක් ලැබේවා කියා මෙතුමා බඹලොව ඉඳලා සිතක් යෙදුවා. සැබවින්ම මෙතුමාගේ සිතේ ආකර්ෂණය චිත්ත තරංග වශයෙන් ඒ මහා සාගරයේ සත් දවසක් නිරාහාරව පීනන, මෑණියන් කරපිට තියාගෙන පීනන, කළගුණ දක්වමින් පීනන, මේ පුතණුවන්ගේ මනසට වැටුනා. මේ මාතුපෝෂක කුමාරයන් වහන්සේගේ මනසට එකවාරයටම ලොව්තුරා බුදුවරයන් වහන්සේලාගේ ප්‍රාර්ථනාව හිතට නැගුණා.

බුද්ධොහං බොධයිස්සාමි
මුත්තොහං මොචයෙපරෙ
නිණ්ණොහං තරයිස්සාමි
සංසාරොඝා මහබ්භයා

මං හිතනවා මුන් වහන්සේ මීට ඉස්සරලා මේක අහලවත් නෑ. මේ අරහත්ත බ්‍රහ්මරාජයාගේ චිත්ත තරංග මනසට වැදීම නිසා හිතේ පහල වූ ශුද්ධා ප්‍රාර්ථනාවක්. මේ ගාථාවේ තේරුම කාටත් පැහැදිලියි.

**බුද්ධොහං බොධයිස්සාමි.** මම ලොව්තුරා බුදු වී අන් අයටද අවබෝධ කරවන්නෙමි.

**මුක්තොහං මොචයෙ පරෙ.** මම දුකින් මිදී අන් අයත් ද දුකින් මුදවා ගන්නෙමි.

**තිණ්ණෝහං තාරයිස්සාමි - සංසාරොඝා මහබ්භයා.** මහත් භය ජනක ඕඝයෙන් මා එතෙර වී අන් අයද එතර කරවන්නෙමි කියන මෙන්න මේ ශුද්ධ ප්‍රාර්ථනව හිතට නැගුනා. ඒ නිසා එදවස්හිම මහා සාගරයෙන් ගොඩ එන්න ලැබුණා. මෑණියන්ගේ ජීවිතය රැකගන්න හැකිවුණා. ජීවිතාන්තය දක්වාම මෑණියන්ට දෙවිකෙනෙකුන්ට මෙන් මේ පුතනුවෝ සැලකුවා. උදේ සවස බුදුන් වඳින්නාක් මෙන් තම මෑණින්ගේ පතුල මත නළල තබා වැන්දා. මෑණියන්ට කෑම බීම ඇඳුම් පැළඳුම් බෙහෙත් හේත් සෑමදෙයක්ම සපයාදුන්නා. උණු පැන් සිසිල් පැන් නාවමින් ඇඟ පිරිමදිමින්, හිස පීරමින්, නියපෙතු බාමින් ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට කෙල පඩික්කම් මේවා පිරිසිදු කරමින් මෑණියන්ට පුදුමාකාර ආදරයකින් සැලකුවා. අවසාන මොහොතේදී මෑණියන් පුතණුවෝ සමීපයට කැඳවා හදවතින්ම ආශිර්වාද කළා. ගොඩේදීත් දියෙහිදීත් තම දිවි නොතකා මගේ ආත්ම භාවයට පිහිට වූ කළගුණ දන්න පුතාණන් වහන්ස "මේ සත්කාර උපකාර මාත්‍රෝපකාර හේතුවෙන් ඒකාන්තයෙන්ම ඔබ මතු බුදුවේවා" කියා හදවතින් ආශිර්වාද කළා. සැබැවින්ම මේ බෝසත් කුමාරයන්ගේ සිවි සම්, මස්, නහර, ඇට මිදුලු දක්වාම මේ ආශිර්වාදය විනිවිද ගියා. එතුමාද මෑණියන් වහන්ස මේ ආශිර්වාදය මුදුන් පමුණුවා ගැනීම පිණිස මට අනාගතයේ ලොවුතුරා බුදුබවම ලැබේවා කියා ප්‍රාර්ථනා කළා. එදා පටන් සත් අසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් තිස්සේ ඒ උත්තමයන් වහන්සේ මවු පිය උපස්ථාන කිරීම් ආදී කළගුණ සැලකීමේ ශීර්ෂයෙන් පාරමී පුරාගෙන ආවා. සිතින් බුදු බව පතමින් පුරාණ ගෞතම බුද්ධ ශාසනයේ පටන් වචනයෙන් බුදු බව පතමින් නවාසංඛෙය්‍ය කල්ප ලක්‍ෂයක් පෙරුම් පුරාගෙන ආවා. මෙසේ සොළසාසංඛෙය කල්ප ලක්‍ෂයක් අනියත බෝසතාණන් වහන්සේ නමක් වශයෙන් පෙරුම් පුරා දීපංකර පාද මූලයේදී අෂ්ඨ ධර්ම සමවධානයෙහි යෙදී මතු බුදු වන බවට නියත විවරණ පතුල් ලැබුවා.

Sampajanna

මනුස්සත්තං ලිඞ්ග සම්පත්ති
හෙතු සත්ථාර දස්සනං
පබ්බජ්ජා ගුණ සම්පත්ති
අධිකාරෝච ඡන්ද තා
අට්ඨ ධම්ම සමෝධානා
අභිනීහාරො සමජ්ඣති

මහ බෝසතාණන් වහන්සේලා නියත විවරණ පතුල් ලබන්නේ කරුණු අටක් එකතුවීමෙන්

1. මනුස්සත්තං - මනුෂ්‍යාත්මය ලබා සිටින්නට ඕනෑ
2. ලිඞ්ග සම්පත්ති - පුරුෂාත්මය ලබා සිටින්නට ඕනෑ
3. පබ්බජ්ජා - පැවිදි වී සිටින්නට ඕනෑ.
4. ගුණසම්පත්ති - පඤ්චාභිඥා අට්ඨ සමපත්ති ලබා සිටින්නට ඕනෑ.

5 - 6. හේතු සත්ථාර දස්සනං - එදවස්හිම අර්හත්වය ලබන්න තරම් හේතු සම්පත් තියෙන්නට ඕනෑ. සර්වඥ බුදුරජාණන් වහන්සේ නමක් දැක ගන්නට ඕනෑ.

7. අධිකාරො - ආත්ම පූජාවෙන් බුදු බව පතන්නට ඕනෑ.
8. ඡන්දතා - බලවත්ම කුසලච්ඡන්දයක් පහළ වෙන්නම ඕනෑ ලොව්තුරා බුදුවෙන්න.

අට්ඨ ධම්ම සමොධානා අභිනීහාරෝ සමජ්ඣතී. මේ කාරණා අට එක්කාසු වීම නිසා මතු ලොව්තුරා බුදුවෙන බවට නියත විවරණ ලැබෙනවා.

එදා දීපංකර සර්වඥරාජෝත්තමයන් වහන්සේගෙන් සුමේධ තාපසයන් වහන්සේ නියත විවරණ ලැබුවා. එදා පටන් සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් තුල සූවිසි බුද්ධ ශාසනයක නියත විවරණ පතුල් ලබමින් සමතිංසක් පාරමී පුරමින්, පඤ්ච මහා පරිත්‍යාග, ත්‍රිවිධ

Sampajanna

අර්ථචර්යා සම්පූර්ණ කරමින් මහා පොළොව කම්පා කරවමින් ලොව්තුරා බුදුවීම සඳහා බෝධි කාරක ධර්මයන් මුදුන් පමුණුවා ගත්තා. මෙසේ විසි අසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් පිරූ පාරමිතානු භාව බලයෙන් අන්තිම ආත්මභාවයේ සිද්ධාර්ථ ගෞතම නමින් ලොව පහළ වී බෝමුල අරා වැඩ ඉඳගෙන සපරිවාර මාර පරාජය කොට තමන් වහන්සේ උතුම් ලොව්තුරා සම්මා සම්බුදු වුණා. සවාසනා සකලක් ක්ලේසයන් සෝදා හරිමින්, දස බලඥාන, චතුර්වෛශාරද්‍ය ඥාන, අනන්ත බුද්ධඥාන, පරිවාර කොට ඇති සර්වඥතාඥාන, ප්‍රතිලාභයෙන් එදා ශාන්තිනායකයන් වහන්සේ ගාම්භීර චතුරාර්ය සත්‍ය ස්වයම්භූඥානයෙන් අවබෝධ කර ගත්තා.

බුද්ධො සො භගවා බෝධාය ධම්මං දෙසති, තමන් වහන්සේ බුදු බවට පත්වෙලා මාස දෙකක්ම නිවන් සැප වළඳලා බ්‍රහ්මරාධනය පිළිගෙන දස දහසක් ලෝකධාතුවට ගාම්භීර චතුරාර්ය සත්‍ය ධර්මය ධම්මචක්කප්පවත්තන සූත්‍රාන්ත දේශනාවෙන් දේශනා කොට වදාළා. පළමුවෙනි දම් දෙසුමෙන්ම අසංඛෙය්‍යක් පිරිස සෝවාන් ඵලයටත් දහඅට කෝටියක් බ්‍රහ්මයන් රහත් භාවයටත් පමුණුවා වදාළා. එදා පටන් සතලිස් පස් අවුරුද්දක් මුළුල්ලේ දෙසූ අමා දහම් වැස්සෙන් තෙමුණු අසංඛෙය්‍ය ගණන් ජනතාව මාර්ගඵල නිර්වාණ ධාතුව සාක්ෂාත් කර ගත්තා. සූවිසි අසංඛෙය්‍යක් පිරිස සෝවාන් බවට එපමණක්ම පිරිසක් සකදාගාමී බවටත් එපමණම පිරිසක් අනාගාමී බවටත් එපමණම පිරිසක් අරහත් බවටත් පමුණුවා වදාළා.

අනාගතය බලා මහනෙල් මල් සුවඳ විහිදුවන ශ්‍රී මුඛ පද්මයෙන් සුදු බුදුරැස් විහිදෙන දළදා ස්පර්ශ කරමින් අෂ්ඨාංග සමන්නාගත බ්‍රහ්මස්වර විහිදුවමින් සූවාසූ දහසක් ධර්මස්කන්ධය දේශනා කොට වදාළා. සියලු බුදු කිස නිමවා තමන් වහන්සේ නැවත ජාතියක්, ජරාවක්, ව්‍යාධියක්, මරණයක්, සෝකයක්, පරිදේවයක්, දුකක්, දොම්නසක්, උපායාසයක්, අප්‍රිය සම්ප්‍රයෝගයක්, ප්‍රිය විප්‍රයෝගයක්, ඉච්ඡාවිඝාත දුකක්, පඤ්චෝපාදාන දුකක්, නැති අජාති අමර, අව්‍යාධි, අමෘත අසංඛතධාතු සංඛ්‍යාත අනුපාදිශේෂ පරිනිර්වාන ධාතුවෙන් අමාමහ නිවන්පුර වැඩියා. ඒ සර්වඥයන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ අනුශාසනාවකුයි දැන් මේ සම්පූර්ණ වන්නේ. උන්වහන්සේගේ

ඒ බෝධි ප්‍රාර්ථනා සඵල කරගත්තාක් මෙන් අවුරුදු පන්දාහක් උන්වහන්සේගේ ධර්ම ශක්තිය නෛර්යයානිකත්වයේ පවත්නා බැවින් ඒ ධර්මානුධර්ම ප්‍රතිපත්තිය අනුගමනය කරමින් ශ්‍රේෂ්ඨතම කලගුණ සැලකීමේ පිංකමක් අද මේ වාරියපොල දිසා රෝහලේ සිද්ධවෙනවා කියන එක අප කාටත් දැන් පැහැදිලිව පේනවා. මේ සම්බන්ධ කිවයුතු වූ වැදගත් කරුණු රාශියක් දැන් ප්‍රකාශ වෙලා තියනවා. ඒ නිසා අපි පළමුවෙන්ම තෙවසරකට පෙර අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථා සංඝ සභාවේ ප්‍රධාන සභාපති නාථගන ආරණ්‍යය සේනාසනාධිපති අතිපූජනීය පණ්ඩිත ගැටමාන්නේ ශ්‍රී විමලවංසාභිධාන මාහිමිපාණන් වහන්සේද මේ උතුම් පිංකම සිය දිව නෙතින් දැක අනුමෝදන් වෙත්වා කියා ආරාධනා කරලා මේ විස්තර දේශනයට හැරෙමු.

ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාව තමන් අවබෝධ කරගෙන, අන් අයට අවබෝධ කරවීමයි. තමන් ආත්මදමනය කරගෙන, අන් අයට ආත්මදමනයට උපදෙස් දීමයි. තමන් සංසිඳීගෙන, අන් අයට සංසිඳීම පිණිස මග පාදා දීමයි. තමන් එතෙරවීගෙන, අන් අයට සංසිඳීමට උපකාර වීමයි. තමන් සියලු කෙලෙසුන් පරිනිර්වානයට පත්කොට අන් අයටත් ක්ලේස පරිනිර්වානය පිණිස උපකාරවීමයි. මේකයි උන්වහන්සේගේ අනුශාසනාව. සල්ලේඛ සූත්‍රයේදී මේක හොඳට පහදා දීලා කියනවා.

අත්තනා අපලිප්පලිපන්නෝ පරං පලිප්පලිපන්නං උද්ධරිස්සති ඨානමෙතං විජ්ජති කියා ඒ කියන්නේ මඩේ එරුණ එකෙක් තවත් මඩේ එරුණ එකෙකු ගොඩ ගන්න සමර්ථ වන්නේ නෑ. මඩෙන් ගොඩවූ කෙනෙක්ම මඩේ එරුන කෙනෙකු ගොඩ ගන්න සමර්ථ වෙනවා. ඒ වගේ තමන් වහන්සේ චතුරාර්ය සත්‍ය අවබෝධ කරගෙන සිටියොත් තමයි අනෙක් අයට අවබෝධ කරවන්ට පුලුවන් වන්නේ. තමන් ආත්ම දමනය කරගත්තොත් පමණයි අන් අයටද ආත්ම දමනයට උපදෙස් දෙන්න පුලුන් වන්නේ.

මේ අනුව සලකා බැලීමේදී ඒ සූත්‍ර පාඨය කරන ශ්‍රේෂ්ඨ අනුශාසනාවක් අද නාථගන ආරණ්‍යය සේනාසනස්ථ දායක

Sampajanna

මණ්ඩලයේ මෙහෙයවීමෙන් මුදුන්පත් වුනා. ඒ කියන්නේ කළගුණ තමන් දැනගෙන කළගුණ සලකමින් අන් අයටත් එයට මඟ පාදාදීම මෙතන සඳහන් වෙනවා. විශේෂයෙන්ම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ අනුශාසනාවක් පැහැදිලි වෙනවා. යම්කිසි කෙනෙක් තමන් නිවී සැනසීගෙන අන් අයටත් නිවීමක් සැනසීමක් දෙනවානම් ඒක සාර්ථක වෙන බව. ඒ නිසා මේ ආරෝග්‍යශාලා සේවාව තුලින් සිද්ධ වන්නේ තමන් නිවීමක් සැනසීමක් සලසාගෙන අන් අයට නිවීමක් සැනසීමක් උදාකර දීමයි කියන එක කාටත් පැහැදිලි වෙනවා. ඒ නිසා මේ සම්බන්ධව යෙදුවාවූ සෑම කුසල චින්තනයක් පාසාම තම තමාගේ සන්තාන පළමුවෙන් නිවාගෙන සනසාගෙනයි මේ කටයුතු වල යෙදෙන්නේ. විශේෂයෙන්ම යම් කිසි කෙනෙක් සීල සමාදානයක යෙදෙනවා. සීල සමාදානයක යෙදීමෙන් මුළු ලෝකයටම අභය දානය දුන්නා වෙනවා. **පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි** කියා ශික්ෂාපදය සමාදන් වෙනකොටම මුළු ලෝකධාතුවම අභය දුන්නා. මක්නිසාද පළමුවෙන් තමාගේ සිතේ අභය පිහිටුවා ගත්තා. ලෝකයට මම හිංසාවක් කරන්නේ නෑ. කුරාකුහුඹුවෙකුටවත් මම හිංසාවක් කරන්නේ නෑ. මගෙන් කිසිම සතෙකුට හිංසාවක් නොවේවා කියන එකයි **පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි** කියන්නේ. ඒ චිත්ත සංතානේ පහළ කරගත් ඒ අභය දානය නිසා මුළු ලෝක ධාතුවටද සියලු සත්වයන්ටද අභය දුන්නා වෙනවා. මෙන්න මේ වගේ තමයි අද ආරෝග්‍යශාලා සේවයත්. තමන් සැනසීගෙන දෙවියන් සහිත ලෝකයාට උදාර සැනසුමක් බෙදා දුන්නා වෙනවා.

ඒ සඳහා අපි දැන් විෂය මාතෘකාවකට හැරෙන්නයි සූදානම් වන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දිනක් සේනාසන චාරිකාවක වඩිද්දී එක්තරා කුටියක ගිලන්ව අසරණව ආබාධිතව මරණාසන්නව වැතිරගත්ත තිස්ස කියන ස්වාමින් වහන්සේ දැක්කා. මේ ස්වාමීන් වහන්සේට උපස්ථාන කරන්න කිසිවෙක් නෑ. මේ ස්වාමීන් වහන්සේට උපස්ථාන කරලා කරලා එපාවෙලා සියලුදෙනා ඉවත්වෙලා. මොකද මේ ස්වාමීන් වහන්සේට කුඩා බිබිලි ඇතිවෙලා මේවා ලොකුවෙලා ලොකුවෙලා අන්තිමට නෙල්ලි ගෙඩි, බුළු ගෙඩි, දෙහි ගෙඩි, බෙලි ගෙඩි තරම් ලොකුවෙලා පැසවෙලා පුපුරලා ඔක්කොම හම ගැලවිලා ඇටකටු දක්වාම තුවාල වෙලා. දැන් උන්වහන්සේට අතක් පයක්

Sampajanna

ඔසවන්නවත් බෑ සිහිය තියෙනවා. උන්වහන්සේගේ චීවරය ශරීරයට ඇලිලා ලේ සැරව වලින් කාටවත් පිලිදැගුම් කරන්න බෑ. භයානක කුෂ්ඨ රෝගයක්. පුදුමයි පණාටික බේරුන හැටි. බුදුරජාණන් වහන්සේ දැකලා ඇසුවා. ඇයි මේ නමට උපස්ථායකයෙක් නැද්ද. අනේ නෑ ස්වාමීනි, උපස්ථාන කළා. ඒ ඇත්තන්ට උපස්ථාන කරලා ඉවරයක් නෑ. ඒක මගේ අවාසනාව. දැන් ඉතින් මං මරණාසන්නව අසරණව ඉන්නවා. ආනන්ද ස්වාමීන් වහන්සේට විධාන කළා. ආනන්දය උණු පැන් ටිකක් සූදානම් කරගන්න. මේ නමට අපි උපස්ථාන කරන්න. තුන්ලෝකධාතුවට දිනපතා සූවිසි කෝටි ලක්ෂවාරයක් මහා කරුණාව විහිදුවන මේ මහා කාරුණිකයාණන් වහන්සේ තමන් වහන්සේ ශ්‍රී හස්තයෙන් මේ තුවාලවලින් වනයක් බවට පත්වූ මේ ස්වාමීන් වහන්සේගේ ශරීරය නෑව්වා. ඉතාම ප්‍රවේශමෙන් වේදනාව නූපදනා පරිදි උණුපැන් වලින් තෙමමින්, තෙමමින්, අර සිවුරු බුරුල් කරලා ඇඟෙන් ගලවා ගත්තා. මේ සිවුර සෝදලා වනන්න දුන්නා. මේ ස්වාමීන් වහන්සේගේ ලේ සැරව ඔක්කොම පිහදාලා ඇඟට පහසුව ලබා දුන්නා. සිවුර වේලුනායින් පස්සේ ඒක ඇඟට පහසුව ලබා දුන්නා. සිවුර වේලුනායින් පස්සේ ඒක ඇඟට පොරෝලා ඇහුවා තිස්ස දැන් ටිකක් පහසුද? අනේ ස්වාමීනි මට විශාල සැනසුමක් දැනෙනවා. මේ වෙලාවේ කියාගන්න බැරි සහනයක් මට දැනෙනවා. ඒ එක්කම ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී හස්තයෙන් මගේ මේ දුක්ඛිත ආත්මයට පිහිටක් ලැබීම නිසා මට කියා ගන්න බැරි තරම් සැනසුමක් ස්වාමීනි, ඒ වෙලාවේ උන් වහන්සේ වදාළා තිස්සය, මේ රෝගය කාගෙවත් වරදක් නොවේ. ඒක සංසාරේ තමාම කරගත්ත කර්මයක විපාකයක් පෙර ජාතියක ළිහිණි වැද්දෙක්ව සිට ලිහිණියන්ට වධ හිංසා කළ පාපයක් නිසා මේ දුකට පත් වුනා. අදට පමණක් නොවෙයි. අනන්ත ජාතිවල මේ දුක විඳලා, විඳලා ආවා. මේ අන්තිම ආත්මභාවය. රෝගයේ කර්ම විපාකය පහදා දීලා චතුරාර්ය සත්‍ය ප්‍රති සංයුක්ත දේශනයක් පැවැත්තුවා. මේ තරම් ගිලන්ව සිටිය මේ ස්වාමීන් වහන්සේ ඒ ගිලන් ඇඳේම ගිලන් සයනයේම සියලු කෙලෙසුන් නසා මහා රහත් භාවයට පත් වුණා. මෙන්න මේකයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ආදර්ශය. ශාරීරික වශයෙන් උපස්ථාන කලා පමණක් නෙමෙයි. මානසික වශයෙන් සිතට සැනසුමක් දීලා නැවත මේ

දුක් කන්දරාවට භාජන නොවන සේ සංසාර කාන්තාරයෙන් එතෙර වී අමාමහ නිවන සාදාගන්නටත් උපකාර උනා. මෙන්න මේකයි ගිලානෝපස්ථාන ආරෝග්‍යශාලා සේවාවේ පරමාර්ථය.

ඒ නිසා දැන් අපි මේ පිංකමේ ඉතාම වැදගත් පැත්තට හැරෙන්නට ඕනෑ. ඒ වැදගත් පැත්ත තමයි දැන් මෙතනට සිය දහස් ගණන් රෝගීන් එනවා. දිනපතා සියයකට වඩා වැඩි පිරිසක් මෙතන ප්‍රතිකාර ලබනවා ඇති කියා අප විශ්වාස කරනවා. මේ ආරෝග්‍යශාලා වගේම ඒ විදිහට දිනපතා සිය ගණන් රෝගීන් මෙතෙනට පැමිණිලා කායික වශයෙන් ප්‍රතිකාර ලබා ගන්නවා පමණක් නෙමෙයි. මානසික වශයෙන් ප්‍රතිකාරයක් වෙන චෛතසික සැනසුමක් උදාකර ගන්නටද මේ අපේ වස්තු පරිත්‍යාගයත් අතිශයින්ම උපකාර වේවා යි කියන මෛත්‍රී භාවනාව අපි දැන් පවත්වන්නට ඕනෑ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ශාසනයේ ක්ෂීර පායාස පූජාව කරන්න පෙරුම් පුරාන ආවා සුජාතා සිටු දේවිය. ඒ සුජාතා සිටු දේවිය බුදුවෙන දවසේ ක්ෂීර පායාසය පූජා කරමින් ආශිර්වාද කළා. ස්වාමීනි මාගේ ප්‍රාර්ථනාව ඉෂ්ඨ වුණා. ස්වාමීනි, ඔබ වහන්සේගේද ප්‍රාර්ථනාව ඉෂ්ඨ සිද්ධ වේවා කියලා. මෙයින් පැහැදිලි වෙනවා මේ ක්ෂීර පායාසය සමග තමන්ගේ ආශිර්වාදය, මෛත්‍රිය, සිත පරිත්‍යාග කළ බවයි. එදා මේ ක්ෂීර පායාසය හතලිස් නව පිඩක් කොට වළඳාගෙනයි එම ආශිර්වාදයත් ඇතුව බෝමුල අරා වැඩ ඉඳගෙන ලොව්තුරා සම්මා සම්බුදු වුණේ. ඒ වගේ මේ වස්තු පරිත්‍යාගයේ පිනින් අපේ දායක මඩුල්ල ඒ සිය දහස් ගණන් ලක්ෂ ගණන් භාණ්ඩ පරිත්‍යාග කරන විට මේ වස්තු පරිත්‍යාගයක් එක්ක මේවා පරිහරණය කරන වෛද්‍යවරුන්ද, මේ කටයුතුවල යෙදෙන සේවක සේවිකාදීන්ද මෙයින් ප්‍රයෝජන ගන්න සියලුම රෝගී පිරිසද නිදුක් වෙත්වා, නිරෝගි වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, නිවන් දකිත්වා කියන මේ සුද්ධ ප්‍රාර්ථනාවයි ඒ පූජාව ඇතුලේ තිබෙන්නට ඕනෑ. ඒ නිසා අපි හැම වෙලාවේම ලැබෙන හැම පරිත්‍යාගයකදීම අපි මෛත්‍රී භාවනාව පිරිනමන්න පුරුදු වෙනවනම් මහේශාක්‍ය පිංකමක් බවට පමුණුවාගන්න පුළුවන්. අපේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ බෝධිසම්භාර පුරන කාලයේ ස්වල්ප වූද පූජාවක් පරිත්‍යාගයක්

Sampajanna

දානයක් දුන්නත් ඒක හරවනවා බ්‍රහ්ම විහාර භාවනාවට. පූජක බ්‍රාහ්මණයාට දරූ දෙන්නා දන්දීලා දවසක් පුරා හැට පැයක් මුළුල්ලෙහි උන්වහන්සේ සිව් බඹ විහරණ භාවනාවෙන් තමයි දවස ගෙව්වෙ. ඒක උන්වහන්සේගේ ආවේණික චාරිත්‍රයක්. උන්වහන්සේගේ අනුශාසනය කරන බෞද්ධයන් වශයෙන් අප සැමදෙනාම මේ වගේ අවස්ථාවලදී මෛත්‍රී භාවනාවට, කරුණා භාවනාවට, මුදිතා භාවනාවට, උපෙක්ඛා භාවනාවට, හරවන්නට ඕනෑ. ඒක නිසා ඒ අයුරින් දැන් හිත යොදලා මේ පිංකම මහත්ඵල කරගැනීමට බලාපොරොත්තු වෙමු. ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා නිවන් දොරටු රාශියක්, සමථ භාවනා හතලිහක්, විදර්ශණා භාවනා රාශියක් වශයෙන් කර්මස්ථාන භාවනා තියෙනවා. විදර්ශණා භාවනා දොරටු රාශියක් වුනත් විදර්ශණාවනම් එකයි. සමථ භාවනා දොරටු හතලිහක් තියෙනවා. ඒ වගේ ප්‍රභේද වශයෙන් ගන්නවනම් සිය ගණනක්, දහස් ගණනක් තියෙනවා. මින් ඉතාම වැදගත් භාවනා මාර්ගයක් තමයි මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ඛා කියන බ්‍රහ්ම විහාර භාවනාව.

මෙත්තා, කරුණා. මුදිතා, උපේකඛා යන මේ ගුණාංග හතරට බ්‍රහ්ම විහාර කියන නම ලැබිලා තියෙන්නේ ශ්‍රේෂ්ඨත්වය නිසා හා නිර්දෝෂත්වය නිසයි. ලෝකධාතුවේ ධ්‍යාන වඩා බඹලොව ගිය උතුමන්ට කියනවා බ්‍රහ්මයෝ කියලා. බඹලොව ඉන්න බ්‍රහ්මයෝ පවත්වනවා ලෝක වාසීන්වෙත ගුණධර්ම හතරක්. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ඛාවන් පවත්වන බැවින් තථාගතයන් වහන්සේ හඳුන්වන්නේ බ්‍රහ්මාති බ්‍රහ්ම කියලා. මේ වගේම දරුවන් හදන දෙමව්පියන්ද දරුවන්ගේ බ්‍රහ්මයන් හැටියට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. දරුවන් වෙත හදපත්ලෙන්ම මෛත්‍රී, කරුණා, මුදිතා, උපේක්ෂාවන් පවත්වන බැවින් දරුවන්ගේ බ්‍රහ්මයෝ දෙමව්පියෝ. ඒ නිසා ශ්‍රේෂ්ඨත්වයට නිර්දෝෂත්වයට පමුණුවන බැවින් ශ්‍රේෂ්ඨ ගුණාංග හතරක් තමයි මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ෂා යන ගුණ. මේවා අප කවර විදිහට දියුණු කළත් කවදාවත් මේවායෙන් විපතක් වන්නේ නෑ. සම්පත්තියක්ම ලැබෙනවා.

Sampajanna

අපේ සැරියුත් මහරහතන් වහන්සේ පෙර ජාතියක අරක නම් තාපස කෙනෙක්ව සිට අවුරුදු හතක් වනගතව මෛත්‍රී භාවනාව වැඩුවා. අවුරුදු 7 ක් මෛත්‍රී වැඩුවා. මහා කල්ප අටක් ආභස්සර බ්‍රහ්ම ලෝකයෙහි බ්‍රහ්ම සම්පත් වින්දා. ආත්ම තුන්සිය වාරයක් සක්දෙව් රජ පදවිය ලැබුවා. පන්සිය වාරයක් චක්‍රවර්ති රාජ්‍යශ්‍රියට පත්වුනා. ප්‍රදේශ රාජ්‍ය සම්පත් මෙතෙකැයි කියා ප්‍රමාණයක් නෑ. ඒ සියල්ල ජාතිස්මරණඥානයෙන් දැනගත්ත මේ උත්තමයන් වහන්සේ නිවන් දක්නා තුරු මාගේ සිතේ ව්‍යාපාදයක්, ක්‍රෝධයක්, වෛරයක්, පටිඝසංඥාවක්, පහළ නොවී සැමදාම පිපුණ නෙළුම් මලක්, මානෙල් මලක්, සමන් පිච්ච මලක් වගේ ප්‍රබුද්ධ වූ මෛත්‍රියෙන් ජීවත් වෙමින් පාරමී පුරා ගන්නට ජාති ජාතිත් ලැබේවා කියා ප්‍රාර්ථනා කළා. ඒ තමයි සාරිපුත්‍ර මහරහතන් වහන්සේ. ඒකාසංඛෙය්‍ය කල්ප ලක්ෂයක් තුල අටමහ නරකයට වැටුනෙ නැතිව පාරමී පුරාගන්න සමර්ථ වුණා. උන්වහන්සේ අවුරුදු හතක් වැඩූ මෛත්‍රී භාවනාවෙන් මේසා විශාල අර්ථසම්භාරයක් ආනිසංස සම්භාරයක් ලැබුවා කියන එක සාරිපුත්‍ර මහරහතන් වහන්සේගේ චරිතාපදානයෙහි සඳහන් වෙලා තියෙනවා. මේ මෛත්‍රී භාවනාව බුදු පසේබුදු මහරහතන් වහන්සේලා ගෞරවයෙන් පුරුදු කරගෙන ආපු දෙයක්.

අපේ මහ බෝසතාණන් වහන්සේ බෝධි සම්භාර පුරන අනේක ජාති වල මෛත්‍රිය පුරුදු කළ ආකාරය අපට හොඳින් දේශනා කරලා තියෙනවා. මහා සීලව රාජ ජාතකය බලන්න මොන තරම් පුදුමද යොදුන් 300 ක් තරම් වට ප්‍රමාණ ඇති මේ ලංකා රාජ්‍ය තරම් විශාල රාජ්‍යයක් කල සීලව මහ රජ්ජුරුවෝ පරම මෛත්‍රිය වැඩූ උත්තමයෙක්. දහසක් අමාත්‍ය මණ්ඩලයේ ද්‍රෝහී කමක් කල ඇමෙතියෙකු රටින් නෙරපනු ලැබුවා. මේ අමාත්‍යයා සාමන්ත රටක රජ කෙනෙකු සමග මිත්‍රවෙලා සේනාව පිරිවරාගෙන ආවා. මේ රාජ්‍යය පැහැර ගන්න ඇමති මඩුල්ල එකහෙලා අවසර ඉල්ලුවා. කපුටු රැලක් එලවන්නාසේ මේ සතුරු සේනාව පලවා හරින්න අපට අවසර දෙන්න යුද්ධ කරන්න කියලා. සීලව රජතුමා කිව්වා දරුවෙනි මේ රාජ්‍ය නිසා ප්‍රාණඝාත කරන්න මම කැමති වෙන්නෙ නෑ. කැමති කෙනෙක් මේ රාජ්‍යය ගනිත්වා කියලා. සතුරු රජතුමා ඇවිල්ලා විශාල පිරිසක් ඇති රජතුමා ඇමති මඩුල්ලක් එක්ක ජීවග්‍රාහයෙන් අල්ලගෙන හිටුවා පස්

Sampajanna

ගැහුවා සෙහොන් පිට්ටනියේ. නමුත් එදා රාත්‍රියේදී සීලව රජතුමාගේ මෛත්‍රී බලයෙන් නිදහස් වෙන්නද ලැබුණා. මේ පුදුමයක්. සතුරු සේනාව අල්ලන වෙලාවේ මෛත්‍රී භාවනාවෙන්ම මුන් වහන්සේ ගෙව්වා. හිටුවා පස් ගහන වෙලාවේ සිතිවිලි මාත්‍රයකින්වත් ක්‍රෝධයක් නැතිව උන්වහන්සේ මෛත්‍රී වැඩුවා. රාත්‍රි කාලයෙහි මිනීමස් කෑමට එන දහස් ගණනාවක හිවලුන් රංචුවක් පැමුණුනා. නායක හිවලා රජතුමාගේ ගෙල ඩැහැ ගත්තා. මහත් වීර්ය ඇති රජතුමා මේ හිවලාගේ ග්‍රීවය බෙල්ලට තද කරන කොටම මරහඩින් කෑගැහුවා. අන් සියලු හිවල්ලු දුවලා යන්ට ගියා. මේ නායක හිවලාගේ දැඟලීම නිසා පොළවේ පස් බුරුල් වුණා. රජතුමා ගොඩ ආවා. ඇමති පිරිසක් ගොඩ ගත්තා. ඒ සොහොනේ පිට්ටනියේ වෙසෙන අමනුෂ්‍යයෝ දෙදෙනෙක් මෙතුමාට උපකාර උනා. අන්තිමේදී සතුරු රජතුමා සමීපයටම එන්න ලැබුනා. සියලු විස්තර දැනගත් සතුරු රජතුමා බලවත් කම්පාවට පත්වෙලා වැඳ නමස්කාරයෙන් සමාව ගත්තා. ජීවිතාන්තය දක්වා ඔවුනොවුන් සමගි ධර්මයද ආරක්ෂා කරගත්තා. මේ පුදුම බලය ලැබුනේ මෛත්‍රී වැඩීම, ඉවසීම වැඩීම නිසයි.

මේ වගේ අනන්ත ජාතිවල බෝසතාණන් වහන්සේ ඉවසීම මුල් කරගෙනම ජයග්‍රහනය කරලා තියෙනවා. ශාන්තිවාද තාපස ජාතක දේශනා ධර්මය මොනතරම් පුදුමද කලාබු රජතුමා තමන් සුරාවකින් මත් වී සසරින් ගෙනා වෛරයක්ද අනුව මේ අහිංසක තාපසයන් වහන්සේට කස පහරවල් පන්සියය, පන්සියය බැගින් තුන් පැත්තකට එක් දහස් පන්සීයක් තැලෙව්වා. අත්දෙක පාදෙක කැප්පෙව්වා. කන් නාසා කැප්පෙව්වා. ඒ හැම වරෙකම ශාන්තිවාදී තාපසයන් වහන්සේ මෛත්‍රී සිතම වැඩුවා. අන්තිමේදී කලාබු රජ්ජුරුවෝ අහනවා තමන් වහන්සේගේ ශාන්තිය තවම තියෙනවද කියලා. උන්වහන්සේ ප්‍රකාශ කලා මහරජ්ජුරුවෙනි, ශාන්තිය අත්පා වල කන්නාසාවල නෙමෙයි තියෙන්නේ. ඒක තියෙන්නේ පුරුදු කරගත්ත චිත්ත සන්තානේ තුලයි. වෙන කරගන්න දෙයක් නැති රජු විලුඹු පහරක් ගහලා යන්න ගියා. ටික වෙලාවයි ගතවුනේ පොලව පලාගෙන ගිනිදැල් ඇවිල්ලා කලාබු රජු අපායට ඇදගෙන ගියා. සේනාධිපතිතුමා දැනගෙන ඇවිල්ලා මේ ශාන්තිවාදී තාපසයන් වහන්සේට වැඳලා අර වන මුඛ සෝදලා බෙහෙත් ගල්වලා ආරාධනා කලා. ස්වාමීනි, කිසිවක් නොදන්නා

Sampajanna

නොදරුවෙක් වැනි මේ අසරණ රජ්ජුරුවන්ට සමාව දෙන්න කියා. මහ බෝසතාණන් වහන්සේ ප්‍රකාශ කර සිටියා මාවැන්නන් කවදාකවත් කිපෙන්නේ නෑ. චිරං ජීවතු සෝ රාජා - නහි කුජ්ඣන්ති මාදිසා. මගේ අත්පා කන් නාසා කැප්පෙව්ව රජතුමා චිර කාලයක් දීර්ඝායු වින්දනය කෙරේවා. මා වැන්නවුන් කිපෙන්නේ නෑ කියලා උන් වහන්සේ හදවතින්ම ඉවසීමෙන් කථා කලා.

මේ විදිහට අනන්ත ජීවිතවලදී උන්වහන්සේ මේ මෛත්‍රිය පුරුදු කරගෙන තිබුනා. චුල්ල ධම්ම පාල කුමාරයා වයසින් මාස 7 යි. කුමාරයා වඩාගෙන සිටිය මව්තුමිය නැගිට්ටේ නෑ කියලා කුමාරයා කෙරෙහි කෝපවෙලා මහා ප්‍රතාප රජතුමා කෙහෙල් ගොබ්බක් කපන්නාසේ මේ දරුවාගේ අත්පා කැප්පෙව්වා, පෙතිපෙති ගැස්සෙව්වා. මේ වෙල්ාවේ මේ කුඩා දරුවාට කථා කරගන්න අම්මේ, තාත්තේ කියා බැරිවුනත් දියුණු කරගත්ත මනසක් තිබුනා. මේ දරුවා හිතාගත්ත රජතුමාගේ වරදක් නොවෙයි, මෑණියන්ගේ වදරක් නෙමෙයි, මගේ වරදක් නෙමෙයි, සංසාර දෝෂයක්. ඒ නිසා මේ අඬා වැලපෙන මව් තුමියටත්, රජතුමාටත්, වදදෙන වධකයාටත් එක හා සමාන මෛත්‍රියක් කරන්නට ඕනෑ කියලා උන්වහන්සේ හදවතින්ම මෛත්‍රිය කරලා සුගති පරායන වුනා.

ඒ වාගේ අනන්ත ජාතිවලදී උන්වහන්සේ මෛත්‍රී ගුණය පුරුදු කරගෙන ආවා. ඒකරාජ බෝධිසත්ව චරිතය දෙස බලන්න. මේ ඒකරාජ රජතුමා පරම ධාර්මික රජ කෙනෙක්ව ඉන්න අතරට සතුරු රජකෙනෙක් ඇවිල්ලා ජීවග්‍රහයෙන් අල්ලා ගත්තා. රට පැහැර ගත්තා. කකුල් දෙකෙන් අල්ලාගෙන රැහැනින් බැඳ බාල්කයේ එල්ලුවා. මේ අල්ලාගත්ත වෙලාවෙත් එල්ලන වෙලාවෙත් ඒකරාජ රජතුමා එකහෙලාම මෛත්‍රී වඩමින් ඉන්න කොට උන්වහන්සේට මෛත්‍රී ධ්‍යාන පහළ වුනා. ධ්‍යාන බලෙන් බැමි ලෙහුනා. අහසේ පලක් බැඳගෙන වාඩි වුනා. බලාන හිටිය මුරකරුවෝ විස්මයට පත්වෙලා සතුරු රජතුමාට දැනුම් දුන්නහම දිගා වෙලා වැඳ නමස්කාර කොට ආරාධනා කලා ආසනයට වඩින්න සමාව දෙන්න කියලා. උන්වහන්සේ අහසේ දීම සමාව දීලා රාජ්‍ය බාර ගන්න කියද්දී රාජ්‍ය බාර නොගෙන දසරාජ ධර්මයෙන් රාජ්‍යය කරන්න කියලා සතරු රජ්ජුරුවන්ටම පවරලා

Sampajanna

අහසින් හිමවත් පෙදෙසට වැඩියා. මේ මොන පුදුමයක්ද තමන්ගේ රට රාජ්‍ය පැහැර ගන්නා වෙලාවේදී පවා මෛත්‍රියෙන් ගත කරන්න මොන තරම් සංසාර පුරුද්දක් මුන් වහන්සේට තිබුනද.

දීඝිති කෝසල රජතුමා ගැන බලමු. මොන තරම් පුදුමද. මව්පියන්ගේ ශරීරයන් ඝාතනය කරද්දී කෑලි හතරට කපා දමද්දී දීඝායු කුමාරයා ඉවසූ හැටි පුදුමාකාරද? අන්තිමේදී සතුරු රජ්ජුරුවන් පරම මිත්‍රයෙක් බවට පමුණුවා ගත්තේ මේ ඉවසීමේ මෛත්‍රියේ ආනුභාව බලයෙන් නේද? ඒ වගේම තිරිසන් ගත ආත්මයේදී පවා භූරිදත්ත ජාතක දේශනාව, චම්පෙය්‍ය ජාතක දේශනාව, සංඛපාල ජාතක දේශනාව, මහාකපි ජාතක දේශනාව මේ වගේ අවස්ථාවල පුදුමාකාර ඉවසීමක්, උන්වහන්සේ මේ මෛත්‍රී භාවනාවෙන් ලබාගෙන තිබුනානේද? මෙන්න මේ විදිහේ අනන්ත ජාති ශත සහස්‍රයන්හිදී ඒ මෛත්‍රිය පුරුදු කලාවූ ඒ මහා බෝසතාණන් වහන්සේ තමයි දස දහසක් ලෝකධාතු කම්පා කරමින් තුන් ලෝකධාතුවට අසීමිත මෛත්‍රියක් විහිදුවනු පිණිස ලොව්තුරා සම්මා සම්බුදු පදවියට පත්වී වදාලේ.

උන්වහන්සේගේ උපදේශයයි දැන් මේ කවුරුත් අනුගමනය කරන්නේ. ඒ නිසා තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ අපට උගන්වලා තියෙනවා මේ ලෝක ධාතුවෙහි වැඩිසිටි දේ අතුරෙන් උතුම්ම දේ චිත්තය. වැඩිය යුතු දේ අතුරෙන් උතුම්ම දේ ප්‍රඥාව. චිත්තයයි, ප්‍රඥාවයි, හිතයි, නුවණයි කියන දෙක වැඩීම තමයි සමථ විදර්ශණා භාවනා දෙකෙන් කෙරෙන්නේ. මැණික් ගලක් අතට ගත්ත කෙනෙකුට ඒ මැණික් ගලේ එක එක පැත්ත එක එක පාට බලන්න පුළුවන්. එක එක පාට එක එක පැත්තේ තියෙනවා මේ මැණික් ගලේ. ඒවාගේ තමයි යම් කිසි අරමුණක් ගත්තහම එක එක ආකාරයෙන් පෙරල පෙරලා යෝනිසෝ මනසිකාරයෙන් බලන්න පුළුවන්. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ උපදෙස් දීලා තියෙනවා කිසියම් පුද්ගලයෙක් අරමුණු කරගෙන කැමතිනම් මෛත්‍රී වඩන්න පුළුවන්. කැමතිනම් කරුණාව වඩන්න පුළුවන්. කැමතිනම් ද්වත්තිංසංකාර වඩන්න පුළුවන්. කැමතිනම් සතර ධාතු වවත්ථානය, ධාතුමනිසාකාරය, බුද්ධානුස්සති ආදී අනුස්සතියක්, තම තමාගේ නැණ පමණින් ඒ ඒ ලද-

අරමුණ භාවනාවට නගලා චිත්ත භාවනා, ප්‍රඥා භාවනා බවට පමුණුවා ගන්න පුළුවන්.

මේ පිංකම තුලින් අප විශේෂයෙන් බලාපොරොත්තු වන්නට ඕනෑ අර විදිහේ මෛත්‍රී භාවනාවක් කරුණා, මුදිතා, උපෙක්ඛා, භාවනාවක් වැඩෙන හැටියට සිත් යොදන්නට. අද මේ අවස්ථාවේදී අපවත් වී වදාළ අති පූජනීය නාථගන ආරණ්‍යය සේනාසනාධිපති ගැටමාන්නේ පණ්ඩිත ශ්‍රී විමලවංස ස්වාමීන් වහන්සේ අපි අරමුණු කර ගනිමු. උන්වහන්සේගේ ගුණ ජීවිතය විද්‍යාමානව තියෙනවා. අපි විශ්වාස කරනවා ඒ මාහිමියන් වහන්සේ ආරක්ෂා කළ සීල සම්පදාව අනුව පුරුදු කළ ප්‍රතිපත්ති ධර්මයන් අනුව අද හොඳ සුගති ලෝකයක සිට මේ දෙස බලා සැනසෙමින් ජීවත් වෙනවා ඇතෙයි කියලා. ඒ නිසා අපි ජීවත්ව ඉන්න හැටියට සිතින් අරමුණු කරගෙන මෙන්න මේ විදිහට සිතින් මෛත්‍රී භාවනාවක යෙදෙමු. මේසා විශාල ලක්ෂ සංඛ්‍යාත වස්තු පරිත්‍යාගයක් කරමින් දානමාන උපස්ථාන කරමින් කරණ මේ උදාර පිංකම තුලින් නැගෙන ආනිසංස ධර්මයන් ඒ අපවත් වී වදාල ගැටමාන්නේ පණ්ඩිත ශ්‍රී විමලවංස ස්වාමීන් වහන්සේගේ පුනර්භව ආත්මයද අනුමෝදන් වෙත්වා. උන්වහන්සේ නැවත නැවතත් දිව්‍ය මනුෂ්‍යාදී සුගති ලෝකයකම උප්පත්තිය ලබත්වා. උන්වහන්සේ කායික සුවයෙන් සුවපත් වෙත්වා, බිය උවදුරු නැත්තෙක් වෙත්වා. සුවපත් වූ සිත් ඇත්තෙක් වෙත්වා. උන්වහන්සේට ආයුවර්ණ සැප බල ප්‍රඥා පිරී ඉතිරී පහළ වේවා.

උන්වහන්සේට සතර සතිපට්ඨාන, සතර සම්‍යග් ප්‍රධාන, සතර ඍද්ධිපාද, පඤ්චේන්ද්‍රිය, පඤ්ච බල, සප්ත බොජ්ඣංග ආර්ය අෂ්ඨාංගික මාර්ග සංඛ්‍යාත සත්තිස් බෝධිපාක්ෂික ධර්ම මුදුන් පත්වේවා. උන්වහන්සේට සීල විසුද්ධි, චිත්ත විසුද්ධි, දිට්ඨි විසුද්ධි, කඞ්ඛා විතරණ විසුද්ධි, මග්ගාමග්ගඤාන දස්සන විසුද්ධි, පටිපදා ඤාණ දස්සන විසුද්ධි, ඤාණ දස්සන විසුද්ධි කියන මේ විසුද්ධි භාවනා සම්පූර්ණයෙන් මුදුන්පත් වේවා. උන්වහන්සේට දස කසින සමාප්ති දස සමාපත්ති, දස අනුස්සති භාවනා සමා පත්ති, බ්‍රහ්ම විහාර භාවනා අශුභ සමාප්ත්ති, අනේක සමාපත්ති. මේ සියලුම සමථ භාවනා මුදුන් පත්වේවා. නාම රූප විදර්ශනා, ස්කන්ධ විදර්ශනා,



Sampajanna

Sampajanna

ආයතන විදර්ශනා, ධාතු විදර්ශනා, ආර්ය සත්‍ය විදර්ශනා, පටිච්ච සමුප්පාද විදර්ශනා ආදී වශයෙන් තියෙන මේ සියලුම විදර්ශනා භාවනා ඒ මාහිමියන් වහන්සේගේ සන්තානේ සුවසේම පහල වෙත්වා. සම්මර්ශණ ඥාණ, උදයව්‍යය ඥාණ, භංග ඥාණ, භය ඥාණ, ආදීනව ඥාණ, නිබ්බිදා ඥාණ, මුඤ්චිතුකම්‍යතා ඥාණ, පටිසංඛානුපස්සනා ඥාණ, සංඛාරුපෙක්ඛා ඥාණ සහ අනුලෝම ඥාණ කියන මේ ඥාණ පරම්පරාව ඉතාම සුවසේ ඒ සන්තානේ වැඩි දියුණු වෙත්වා. උන්වහන්සේට විදර්ශණාඥානය, ඉර්ධිවිධඥානය, මනෝමය ඍර්ධිවිධඥාණය, දිව්‍යශ්‍රොත ඥාණය, පර චිත්ත විජානන ඥාණය, පූර්වේ නිවාසානුස්මෘති ඥාණය, දිව්‍යංචක්ෂුරභිඥාණය, ආසවක්ඛයකර ඥාණය කියන මේ අෂ්ඨ විද්‍යාවන් පහල වෙත්වා. උන්වහන්සේගේ ප්‍රාතිමෝක්ෂ සංවර සීලය, ඉන්ද්‍රිය සංවර සීලය, භෝජන මාත්‍රඥතාව, ජාගරියානු යෝගය, සද්ධා, හිරි, ඔත්තප්පය, බහුශ්‍රැතභාවය, වීර්යන් සිහිය නුවණ, ප්‍රථමධ්‍යානය, දුතියධ්‍යානය, තතිය ධ්‍යානය, චතුත්ථධ්‍යානය, කියන පසළොස් චරණ ධර්මයන් සර්ව ප්‍රකාරයෙන්ම මුදුන්පත් වේවා. උන්වහන්සේගේ ඉන්ද්‍රිය, බල, බොජ්ඣඞ්ග, මාර්ගාඞ්ග ඉපෙදෙමින් නැවත නැවත සංසාර ගමනේදී සිහිනයකින්වත් නරකාදී සතර අපායකට පත් නොවේවා. සිහිනයකින්වත් ත්‍රිවිධ සත්ව විනාසයකට, අෂ්ඨ දුෂ්ඨක්ෂණයකට පඤ්ච විධ අන්තරාවකට පාත්‍ර නොවේවා. සසර වසනා තුරු චාතුර්මහාරාජික, තාවතිංස, යාම, තුසිත, නිර්මාණ රති, පරනිර්මිත වසවර්ති යන සදිව්‍ය ලෝකයන්හිත් බ්‍රහ්මපාරිසජ්ජය, බ්‍රහ්මපුරෝහිතය, මහා බ්‍රහ්මය, පරිත්තාභය, අප්පමාණාභය, ආබස්සරය, පරිත්තසුභය, අප්පමාණසුභය, සුභකිණ්ණකය, වේහප්පලය කියන මේ බ්‍රහ්මලෝක දහයෙත්, ඒ වගේම ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නේවසඤ්ඤායතනය කියන මේ අරූප බ්‍රහ්ම ලෝක හතරෙන් යම් දවසක අනාගාමි තත්වයට පත්වුනා නම් සුද්ධාවාස භවයෙත් කියන මේ සුද්ධ ස්ථාන වලම ප්‍රතිසන්ධිග්‍රහනය ලබමින් පාරමී පුරා ගන්නට හේතු වාසනාවන්ත වේවා. උන්වහන්සේ නැවත නැවතත් මේ මනුලොව පහළවන සේක්නම් ත්‍රිහේතුක ප්‍රතිසන්ධියනේ ජාතිස්මණඥාණයෙන්, සම්‍යග්ප්‍රඥාවෙන් යුතුව මේ මනුලොව

පහලවී, සත්පුරුෂ සංසේවනයෙන්, සද්ධර්මශ්‍රවණයෙන්, යෝනිසෝ මනසිකාරයෙන්, ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙන් යුතුව බෝධි සම්භාර පුරාගන්නට ජාති ජාතින් වාසනාවන්ත වේවා. උන්වහන්සේගේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, භාජනය, පර්යුපාසනය අප සැම දෙනාටම සසර වසනාතුරා ලැබේවා. උන්වහන්සේගේ පාරමී ප්‍රාර්ථනා සඵල වෙමින්, ත්‍රිවිද්‍යා, ෂඩ් අභිඥා, සිවුපිළිසිඹියා, ඥාණ සහිතව රහත් බෝධිය හෝ පච්චේක බෝධිය උන්වහන්සේ ප්‍රාර්ථනා කරන්නේ යම් බෝධි ඥාණයක් නම් ඒ බෝධිය. එහෙම නැත්නම් අනාගත භවයකදී සුවාසූ දහසක් ධර්මස්කන්දය දේශණා කරමින් සූවිසු අසංඛ්‍ය ගණන ජනතාව අමාමහ නිවන් පුර ලන්නට උතුම් ලොව්තුරා සම්බුද්ධ රාජ්‍යම ලබත්වා කියන මේ මෛත්‍රී භාවනාව අපි වඩමු. මේ පින් පැමිණවීමෙන් කෙරෙන්නෙ මෙත්තා භාවනාවයි.

අනිත් කාරණය දැන් මේ අවස්ථාවට සහභාගි වූ මහා සංඝ රත්නයට, ඒ වගේම මේ පිංකමට පුරෝගාමීව ආරාධනාව කළ සංවිධාන කරන්නට යෙදුන දිසා රෝහලේ ඩී.ඇම්.ඕ. දොස්තර ධර්මකුමාර ද සිල්වා මැතිතුමා එම නෝනා මහත්මිය, සේවක මඩුල්ල හා අනිකුත් වෛද්‍ය පිරිස, නාථගන ආරණ්‍යය සේනාසනස්ථ දායක කාරක මඩුල්ල, ස්පෙක්ට්‍රා ආයතනයේ දායක මඩුල්ල තවත් මේ සිව් දිගින් ආව මේ නානාවිධ භාණ්ඩ පරිත්‍යාග කල සියලුම සැදැහැවත් දායක ාකරක මව්පිය දූ දරු සියලු දෙනාම, එක හිතින් මේ ආරෝග්‍යශාලාවේ ප්‍රතිකාර ලබන රෝගීන්ට මෙත් වඩමින් මේ වස්තු පරිත්‍යාග කරන්නට ඕනෑ. දැන් මෙතෙන්ට පරිත්‍යාග වෙලා තියෙන හදිසි රෝග පරීක්ෂා කිරීම සඳහා ඊ.සී.ජී. යන්ත්‍රය ඇතුලු බෙහෙත් ද්‍රව්‍ය අනෙකුත් අවශ්‍යතාවන් සුරක්ෂිත කර ගැනීමට වටිනා සීත පෙට්ටිය, රෝගීන්ට ප්‍රයෝජනවත් වන ඇඳන්, ඇඳ ඇතිරිලි, කොට්ට, මෙට්ට, රෝද පුටු, ට්‍රොලි ඒ වගේම රෝගීන්ට අවශ්‍ය හැම අංගෝපාංගම මෙම ස්ථානයේ පරිත්‍යාග වෙලා තියෙනවා. ඒ නිසා මේ පරිත්‍යාගයන් පරිහරණය කරන සියලුම රෝගි පිරිස කායික සුවයෙන් සුවපත් වෙත්වා. බිය උවදුරු නැත්තෝ වෙත්වා. සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා. කියන මේ මෛත්‍රිසිත අප වඩන්නට ඕනෑ. එක දවසක් කළ පිංකමෙන් නවතින්නෙ නැතිව දිනපතා මරණාන්තය දක්වා සිහිපත් කරමින් මෛත්‍රී භාවනාවට යොමු කරන්න ඕනෑ. ඒක



Sampajanna

නිසා මෛත්‍රී භාවනාවට සම්බන්ධ මාතෘකාවක් අපි ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ මාතෘකාවට අනුව තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් මේක පුරුදු කරගන්නට අපි දිනපතාම වෑයම් කරන්න ඕනෑ. මේවා මෙනෙහි කරන්නට අපට වෙලාවක් නෑ නේද, වාඩිවෙලා ඉන්න වෙලාවක් නෑ නේද, කියලා පසු තැවෙන්න අවශ්‍ය නෑ. උදේ අවදිවූ තැන පටන් නින්දට යන තුරු දවසේ වැඩ කරමින්ම වැඩවල යෙදී සිටිද්දීම මේ භාවනාව මෙනෙහි කරන්නට අපි පුරුදු වන්නට ඕනෑ. විශේෂයෙන් මෛත්‍රී භාවනාව අත්‍යවශ්‍යම දෙයක්. අද කාලේ විශේෂයෙන්ම අත්‍යාවශ්‍ය දෙයක්. මීට ප්‍රථමයෙන් අනුශාසනා කළ අපේ ඒ සැදැහැවත් මහත්මයෙකුගේ වචනයෙන් කියවුනා රෝගයක් සුවපත් කරගන්නවා වගේම රෝග නිවාරණය කර ගැනම අත්‍යවශ්‍යයි කියලා. ඇත්ත වශයෙන්ම මේ රෝගාබාධ ඇති නොවී ඉන්න ඉතාම අවශ්‍ය දෙයක් තමයි මෛත්‍රී භාවනාව. තමන්ටත් තමන් ඇසුරු කරන්නන්ටත් මේ මෛත්‍රී සිතින් පුදුමාකාර සහනයක් ලබාදෙනු පිණිස අපි මෛත්‍රී භාවනාව පුරුදු කර ගැනීමට අධිෂ්ඨාන කර ගනිමු.

බුදුරජාණන් වහන්සේ මෙත්තානිසංස සූත්‍රයේදී දේශනා කරලා තියෙනවා දිනපතාම යම් කිසිකෙනෙක් මෛත්‍රී භාවනාව වඩන වනම් ඒක සමාධි බවට පමුණුවා ගන්න සමර්ථ වෙනවානම් ආනිසංස එකොළහක් වින්දනය කරනවා කියලා.

1. සුඛං සුපති -
   සැමදා සැපෙන් නින්ද යනවා. සමාධියකට සම වැදුනා වගේ

2. සුඛං පටිබුජ්ජති -
   නෙලුම් මලක් පිපෙන්නාවගේ ප්‍රබෝධයෙන් අවදිවෙනවා. සැපෙන් අවදිවෙනවා.

3. න පාපකං සුපිනං පස්සති -
   නපුරු සිහින නොදකින්නෙක් වෙනවා.

4. මනුස්සානං පියො හොති -
   මනුෂ්‍යයන්ට පැළඳි ආභරණ මෙන් ප්‍රිය මනාප වෙනවා

5. අමනුස්සානං පියො හොති -
   අමුනුෂ්‍යයන්ට අතිශයින්ම ප්‍රිය මනාප කෙනෙක් වෙනවා



Sampajanna

Sampajanna

6. දේවතා රක්ඛන්ති -
දෙවි දේවතාවෝ ඖරස පුත්‍රයෙකු මෙන් රැකබලා ගන්නවා.

7. නාස්ස අග්ගිවා විසංවා සත්ථංවා ඛමති -
ගිනි, අවි, ආයුධ, වස විස, ශරීරගත නොවී ආරක්ෂාව සැලසෙනවා

8. තුවටං චිත්තං සංමාධියති
සිතේ සමාධිය වහ වහාම ලැබෙනවා

9. මුඛවණ්ණො විප්පසීදති -
මුනේ වර්ණය, පැහැය, ප්‍රභාස්වර වෙනවා

10. අසම්මුළ්හො කාලං කරොති -
මරණාසන්න මොහොතේදී නොමුලාව කලුරිය කරණවා

11. උත්තරිං අප්පටි විජ්ඣන්තො බ්‍රහ්ම ලොකූපගො හොති
මතුමේ ජීවිතයේ අර්හත්වය සාක්ෂාත් නොකර ගත්තේ නම් බ්‍රහ්ම ලෝකෝත්පත්තිය ලබනවා.

මේ මනුලොවේදී ලැබෙන අනුසස් දහයයි. පරලොවේදී ලැබෙන අනුසස් එකයි. සියල්ල එකොලහයි. දීර්ඝ සංසාරයේ මේකේ ආනිසංස විඳිනවා. අර සැරියුත් මහරහතන් වහන්සේගේ චරිතාපදානේ වගෙ. ඒක නිසා අපි සෑම දවසේම මේ කරන පිංකම් සිහිපත් කරමින් ඒකම භාවනාවට යොමු කරන්නට ඕනෑ.

අප විසින් මෙතෙකින් රැස්කරගන්නා ලද මේ පරිත්‍යාගමය කුසලානිසංස ධර්ම බලයෙන් මම වෛර නැත්තෙක් වෙමි. තරහා නැත්තෙක් වෙමි, නිදුක් වෙමි, නිරෝගී වෙමි, සුවපත් වෙමි කියලා තමන් වෙත දහස්වරි හරි මෙනෙහි කරන්නට ඕනෑ. ඊලඟට මගේ දෙමව්පියන් ඇතුළු හිතවතුන්ද, මැදහතුන්ද, වෛරී සත්වයෝද මේ කුසලානිසංස බලයෙන් වෛර නොවෙත්වා, තරහ නොවෙත්වා, නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා කියා මෛත්‍රී සිත විහිදුවන්නට ඕනෑ, ඊලඟට ස්ථාන වශයෙන් භූමි වශයෙන් මෙනෙහි කරමින් මෛත්‍රී පතුරුවන්නට ඕනෑ. දිසා වශයෙනුත් ඒ විදිහට මෙත්

Sampajanna

වඩමින් විහිදුවන්නට ඕනෑ. විශේෂයෙන් මෛත්‍රී භාවනාවෙන් ධ්‍යාන 528 ක් ලැබෙන මාතෘකාවක් විසුද්ධි මග්ගයේ සහ පටිසම්භිදා මග්ගයේ උගන්වා තිබෙනවා. අන්න ඒ ගැන හැඳින්වීමක් ඉතාම කෙටියෙන් දක්වනවා. ඒකට සාවධානව සවන්දීගෙන ඉන් එක්තරා කොටසක් හරි භාවිතා කර ගන්නට අපි අධිෂ්ඨාන කර ගනිමු. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ උපදේශයනම් තමන් නිවී අනුන් නිවා ගැනීමේ පිළිවෙත් මග අනුගමනය කිරීමයි. ඒ නිසා මේ මෛත්‍රී භාවනාවෙන් පළමු කොට අපේ චිත්ත සන්තාන නිවෙනවා. සැනසෙනවා. එයින් ලෝක සත්වයාට නිවීමක්, සැනසීමක්, බෙදාදීමට සමර්ථ වෙනවා. දරුවෙකු හදන වඩන මව් කෙනෙක් නිරන්තරයෙන් ඒ දරුවා ගැන පුදුමාකාර මෛත්‍රියක් පවත්වනවා. දරුවාට උණක්, ප්‍රතිශ්‍යාවක්, හිසදරයක්, බඩේ අමාරුවක් හරි හැදුනානම් ඒ මව දරුවාට බෙහෙත් හේත් කරනවා පමණක් නොවෙයි තමන්ගේ මෛත්‍රියද හදවතින්ම පවත්වනවා. ඒ නිසාම ඒ දරුවාට වහාම සුවය ලැබෙනවා. මේ වගේ තමයි අපි ඒ මෛත්‍රිය පුරුදු කර ගත්තහම දුකට පත්වුවන් දුකින් මුදවා ගැනීමේ ශක්තිය ලැබෙනවා. භයට පත්වූවන් භයින් මුදවා ගැනීමේ ශක්තිය ලැබෙනවා. සෝකයට පත්වූවන් සෝකයෙන් මුදවා ගැනීමේ ශක්තිය ලැබෙනවා.

යම්කිසි රෝගියෙක් අරමුණු කරගෙන තමන්ට තමන් මෛත්‍රී කරගෙන ඒ රෝගියා නැත්නම් අසවලා නිදුක් වේවා, නීරෝගී වේවා, සුවපත් වේවා, කියලා ඒ තමන්ගේ මෛත්‍රී චිත්ත තරංග ඔහුවෙත යවන්නට ඕනෑ. ඔහුගේ රෝගය අරමුණු කරගෙන අසවල් රෝගය සුවවේවා, සුවවේවා, සුවවේවා කියා මෛත්‍රී චිත්ත තරංග වශයෙන් යවන්නට ඕනෑ. අනේක චිත්ත සිය දහස් ගණනාවක් වෙනකොට අර රෝගියාගේ සන්තානයේ ඒ මෛත්‍රී තරංගය වැඩිලා, වැඩිලා ඒක හරියට අර ඉලෙක්ට්‍රික් කරන්ට් එකක් වැදුනා වගේ කිරණක් වැදුනා වගේ සුවයක් වීමේ කරුණු යෙදෙනවා. සුවපත් වීමේ භාග්‍ය තියෙනවනම් නිරෝගී බව ලැබෙනවා. එසේ නැතත් ඒකෙන් විශාල සැනසුමක් අත්වෙනවා. මෙන්න මේ නිසා මේ මෛත්‍රී භාවනා පුරුදු කරලා අපි මේ වගේ අවස්ථාවලදී ප්‍රයෝජන ගන්නට බලාපොරොත්තු වන්නට ඕනෑ. යම් කිසි කෙනෙක් නොමග යන කෙනෙක්මත්පැන් බොන කෙනෙක් ඉන්නවනම් ඒ මත්පැන් බොන පුද්ගලයා වෙත තමාගේ

මෛත්‍රී තරංග යවන්නට ඕනෑ. පළමුවෙන් තමන්ට මෛත්‍රී කරගෙන ඒ මධ්‍යපානය කරන කෙනාගේ නළල් තලය සිතින් බලාගෙන ඔහුට මෛත්‍රී වඩලා ගිහින් කියන්නට ඕනෑ. මිත්‍රය ඔය මත්පැන් පානයෙන් වළකින්න. වළකින්න කියලා සැබවින්ම මේක දිනපතා කීප දිනක් කරගෙන යනවිට මේ පුද්ගලයාගේ මනසට වැටහෙන්න ගන්නවා මේක වැරදි වැඩක් මෙය අත්හරින්න ඕනෑ කියලා දෙවි කෙනෙක් කියන්නා වගේ මනසට වැටහෙන්න ගන්නවා. සමහර විට සිල්වත්, ගුණවත්, යහපත් කෙනෙක් බවට පැමිණෙන්නත් පුළුවන්. මෙන්න මේ නිසා නොමග යන්නන් සුමග යවන්නට දුකට පත් වූවන් දුකින් මුදවන්නට රෝගී ආතුරයන් නිරෝගී කරගන්නට මේ මෛත්‍රී තරංග අතිශයින්ම උපකාර වෙනවා. එම නිසා අපි මේ මෛත්‍රී භාවනාව පුරුදු කරගන්නට අධිෂ්ඨාන කර ගනිමු.

මීට පෙර කරණීය මෙත්ත සූත්‍රයෙන් මෛත්‍රී චිත්ත තරංග යවන හැටි පහදා දීලා තියෙනවා. කුරුණෑගල ආරෝග්‍යශාලා පිංකමේදී ඒ වගේම අපි තවත් මෛත්‍රී භාවනාවක් කියා දෙන්නටයි මේ බලාපොරොත්තු වෙන්නේ. විශේෂයෙන්ම තමන්ට තමන් මෛත්‍රිය තියෙනවා. මේ ලෝකධාතුවේ හැම සත්වයෙක්ම තමා වෙත මෛත්‍රී තියෙනවා. ඒ නිසා තමයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මෙන්න මේ විදිහේ සංයුක්ත නිකායේ ගාථාවක සඳහන් කරලා තියෙනවා.

සබ්බා දිසා අනුපරිගම්ම චේතසා
නෙවජ්ජ ගා පිය තර මත්තනාක්වචී
ඒවං පියො පුථු අත්ත, පරෙතං
තස්මා නහිංසේ පරං අත්ත කාමො

මුළු ලෝකධාතුවේ දස දිසාවේම නුවණින් ඇවිද බැලුවොත් තමන්ගේ ජීවිතයට වඩා ප්‍රිය මනාප දෙයක් කිසිකෙනෙකුට නෑ. මේ වගේ සියලුම සත්වයන්ට තමන්ගේ ජීවිතය ප්‍රියයි, මනාපයි ඒ නිසා අර්ථ කැමති, හිත කැමති, වැඩ කැමති හැම නැණවතෙකු විසින්ම තමා ගැන සලකා කිසි කෙනෙකුට හිංසාවක් නොකෙරෙත්වා කියන අනුශාසනාව මේ ගාථාවේ ඇතුලත් වෙනවා. හැමදෙනාටම තමාවෙත මෛත්‍රී ඇති වෙනවා. ඒක උපමා කරගෙන එය සාක්ෂි කරගෙන අන්

Sampajanna

අයට මෛත්‍රී වඩන්නට අපි පුරුදු වෙන්න ඕනෑ. එදා අපි කරණීය මෙත්ත සූත්‍රයේ දී කෙටි ක්‍රමයකින් මේ මෛත්‍රී භාවනාව පෙන්නුවා. අද අපි ඒක තවත් පැහැදිලි කරගන්නටයි මේ සූදානම් වෙන්නේ. කරණීය මෙත්ත සූත්‍රයේ මෛත්‍රියම අපට ඇති මේ විදියේ අවස්ථාවල අර රෝගීන්ට මෛත්‍රී චිත්ත තරංග යවා සුවපත් කරගන්න. ඒ නිසා කරණීය මෙත්ත සූත්‍රයේ තියෙනවා මුලටම වටිනා අනුශාසනාවක් සක්කෝ කියන මේ උතුම් අනුශාසනාව. සක්කෝ කියන්නේ ඉවසීම සමර්ථ බවයි. ලෝකවාසීන් ඉවසීමට සමර්ථනම් තමයි මෛත්‍රියක් පිහිටුවා ගන්න පුළුවන් ඒ නිසා අපි හැම දවසේදීම ඉවසීමට සමර්ථ වෙලා ඒ කරණීය ධර්ම දාහතර සිතේ පිහිටුවාගෙන මේ භාවනාව පුරුදු කරගන්න අධිෂ්ඨාන කරගනිමු.

අනන්ත බුදු පසේබුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස මම පිළිවෙත් පිරිමෙහිලා ඉවසීමෙහි සමර්ථ වෙමි. ඉවසීමෙන් මම කායික සුවයෙන් සුවපත් වෙම්වා, බිය වූ උවදුරු නැත්තෙක් වෙම්වා, සුවපත් වූ සිත් ඇත්තෙක් වෙම්වා, මා මෙන්ම සියලු සත්වයෝද බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස ඉවසීමෙහි සමර්ථ වෙත්වා. කායික සුවයෙන් සුවපත් වෙත්වා. බිය උවදුරු නැත්තෝ වෙත්වා. සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා. මේ විදියට කරුණු දාහතරක් මෙනෙහි කරන්න තියෙනවා. ඉවසීමේ සමර්ත බව, ඍජුබව, විශේෂයෙන් ඍජු බව, සුවච කීකරු බව, මෘදු මොලොක් සිත් ඇති බව, නිහතමානී බව, ලද පමණින් සතුටු වීමේ බව, ලද දෙයකින් සුවසේ යැපීම, නිවනට බාධක වැඩ අත්හැරීම, චාම් පැවැත්මෙන් දිවි පැවැත්වීම, ඉඳුරන් සංවර කර ගැනීම, නුවණින් මුහුකුරවාගෙන වාසය කිරීම සහ සති සම්පජඤ්ඤයෙන් යුතුවීම, ගුණය කෙරෙහි නැවීම, කිසිවෙකු කෙරෙහි තෘෂ්ණාවෙන් නොබැඳීම යන කරුණු දාහතරක්ම මේ වාගේ භාවනාවට නගන්නට තියෙනවා. තමත් එකක් දෙකක් අපි කියන කොට කරුණු තේරුම් ගන්නට පුළුවන්. අනන්ත බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස, මම අවංක සිත් ඇත්තෙක් වන්නෙමි. නිදුක් වන්නෙමි. නිරෝගී වන්නෙමි. සුවපත් වන්නෙමි. දුකින් මිදෙන්මි. නිවන්

දකින්නෙමි. අනිකුත් සියලු සත්වයෝද අනන්ත බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිනි වදාළ වූ ශාන්ත පද නිවන් සැනසෙනු පිණිස අවංක සිත් ඇත්තෝ වෙත්වා. නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, නිවන් දකිත්වා. මේ සැලැස්මට දිගට මෛත්‍රී වඩලා අන්තිමට මෛත්‍රී විස්තරාය පවත්වනවා. අනන්ත බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළ වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස මම කිසිවෙකුට වෛර නොකරන්නෙමි. ක්‍රෝධ නොකරන්නෙමි. ඊෂ්‍යා නොකරන්නෙමි. පළිගැනීම් නොකරන්නෙමි. වංචා නොකරන්නෙමි. රැවටීම් නොකරන්නෙමි. කිසි තැනකදී කිසිවෙකුට අවමන් නොකරන්නෙමි. නින්දා නොකරන්නෙමි. හෙලා දැකීම් නොකරන්නෙමි. කිසි කලෙක කිසිවෙකුට කිසි අයුරකින් දුකක් පීඩාවක් නොකරන්නෙමි. මාමෙන් අනෙකුත් සියලු සත්වයෝද අනන්ත බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස කිසවෙකුට වෛර නොකෙරේවා, ක්‍රෝධ නොකෙරේවා, පළි ගැනීම් නොකෙරේවා, වංචා නොකෙරේවා, රැවටීම් නොකෙරේවා, කිසි තැනෙක කිසිවෙකුට අවමන් නොකෙරේවා, නින්දා නොකරේවා, හෙලා දැකීම් නොකෙරේවා කිසි තැනෙක කිසිවිටෙක කිසි අයුරකින් දුකක් පීඩාවක් කැමති නොවේවා. සියලු දෙනාම සියලු දෙනාගේ සැපයට කැමති වේවා. මීලගට තවදුරටත් මෛත්‍රී විස්ථාරය කරන්න උපදෙස් දීලා තියෙනවා. කරණීය මෙත්ත සූත්‍රයේදී.

අනන්ත බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී වදාළා වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස මම දයාබර මව් කෙනෙක්. දයාබර පිය කෙනෙක්. තම එක පුතු හදාවඩා රැකගන්නා සේ සෑම සතුන් වෙත මෛත්‍රී සිත වඩන්නෙමි. මා මෙන් අනෙකුත් සත්වයෝද, අනන්ත බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස, දයාබර මව් කෙනෙක් දයාබර පිය කෙනෙක් තම එකම පුතු තම දිවි නොතකා රැකගන්නා සේ සෑම සතුන් වෙත අතිශයින් ශාන්ත සීතල මෙත් සිත වඩත්වා. මේ වාගේ උඩ යට සරස සදිසාවේ සියලු සතුන්ට මෛත්‍රී සිත පැතිරිය යුතු හැටි උගන්වා තිබෙනවා. ඊලගට අන්තිමට අනන්ත බුදු



Sampajanna

Sampajanna

පසේ බුදු මහරහතන් වහන්සේ නිවී සැනසී පැමිණ වදාළා වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස මම ඉදින, සිටින, නිදන, ඇවිදින, සෑම ඉරියව්වෙහිදීම අතිශයින් ශාන්ත සීතල මෙත් බඹ විහරණය වඩන්නෙමි. මම නිදුක් වන්නෙමි. නිරෝගී වන්නෙමි. සුවපත් වන්නෙමි. දුකින් මිදෙන්නෙමි. නිවන් ලබන්නෙමි. අනෙකුත් සියලු සත්වයෝද හිඳින, සිටින, නිදන, ඇවිදින සෑම ඉරියව්වෙහිදීම අතිශයින් ශාන්ත සීතල මෙත් බඹ විහරණය වඩත්වා, නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, තවදුරට අන්තිමට ප්‍රාර්ථනා වශයෙන් පවත්වා ගන්නවා. අනන්ත බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ ශාන්ත පද නිවනින් සැනසෙනු පිණිස මම සිව් පිරිසිදු සීලයෙන් සුවඳවත් වන්නෙමි. ඥාණ දර්ශනයෙන් සමන්නාගත වන්නෙමි. සියලු ආසාවන් දුරලන්නෙමි. බුදු පසේ බුදු මහරහතන් වහන්සේලා අවබෝධ කොට නිවී සැනසී පැමිණ වදාළ ශාන්ත පද නිවනින් සුවපත් වන්නෙමි. අනෙකුත් සයලු සත්වයෝද, සිව් පිරිසිදු සීලයෙන් සුවඳවත් වෙත්වා. ඥාණ දර්ශණයෙන් ආලෝකවත් වෙත්වා. සියලු ආසාවන් දුරහැර බුදු පසේ බුදු මහරහත් වහන්සේලා නිවී සැනසී පැමිණ වදාළා වූ ශාන්ත සීතල අමා මහා නිවන් සුවයෙන් සුවපත් වෙත්වා. කරණීය මෙත්ත සූත්‍රය මාතෘකා කරගෙන මේ වගේ විසිතුරු භාවනා මෙනෙහි කරන්න අපි පුරුදු වෙන්න ඕනෑ. එසේ පුරුදු කරගන්නා විට පන්සිය විසි අට ආකාරයකින් මෛත්‍රී ධ්‍යාන ලබන පිළිවෙතත් අපට කවදාහරි අනුගමනය කර ගන්න අවස්ථාවක් ලැබෙන බව ඒකාන්තයි. ඒ නිසා මේ මෛත්‍රී භාවනාවට සම්බන්ධ ඉතාමත්ම වටිනා පිංකමක් අද මුදුන් පමුණුවා ගත්තා. සිය නිවෙස් වලට ගිහිල්ලා මේ ආරෝග්‍ය ශාලාවට හිත එවලා ඒ රෝගාතුර රෝගීන්ට මේ මේ දේවල් අපි පරිත්‍යාග කලා. මේවා පරිහරණය කරන පින්වතුන් නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා ආදී වශයෙන් ඒ අසීමිත මෛත්‍රී චිත්ත තරංග අපි එවන්න පුරුදු වෙන්න ඕනෑ. ඒ වගේම අද දවසේදී මේ පරිත්‍යාග කළ ඇඳන් පරිහරණය කරණ රෝගීන් හැම දවසේම සැතපෙන වාරයක්, වාරයක් පාසා විනාඩියෙන්, විනාඩිය, තත්පරෙන්, තත්පරය ඔවුනට ශරීර සෞඛ්‍ය නිරෝගී සුව ලැබේවා. ඔවුන් මේ ඇඳක කවදාකවත් ජීවිත හනියකට පත්නොවී මේ ඇඳේම සුවපත් වී සිය නිවෙස් වෙත යාගන්නට අපේ මෛත්‍රී බලයද උපකාර

Sampajanna

වේවා කියලා අපි ආශිර්වාද තබාගන්නට ඕනෑ. ඒ වගේම අනිකුත් මේ රෝද පුටු ආදී උපකරණ පරිහරණය කරන සියලුම රෝගීන්ට ප්‍රතිකාර ගන්න විනාඩියක් තත්පරයක් ගානේ සැනසුමක් උදාවේවා. ඒ අය ඒකාන්තයෙන් ඒ පැමිණි එම රෝග වලින් සම්පූර්ණයෙන් සුවපත් වලා සිය නිවෙස් වලට ගිහින් දීර්ඝායුෂ වින්දනය කරන්නට අපේ මේ මෛත්‍රී චිත්ත තරංගද උපකාර වේවා කියන අධිෂ්ඨානයෙන් අපි මෛත්‍රී සිත් එවන්නට ඕනෑ. ඒ වගේම මේ පරිත්‍යාග කල වස්තු පරිහරණය කරන වෛද්‍යවරු සේවක සේවිකාවරු මේවා පරිහරණය කරණ වාරයක් වාරයක් පාසා ඒ හැම දෙනාටත් පාරමී කුසල් වැඩේවා. ඒ හැම දෙනාටත් මේ හේතුවෙන් නිරෝගී සුව දීර්ඝායුෂ ලැබේවා. ඒ හැම දෙනාගේ උපකාර උපස්ථාන මේ රෝගීන්ට දිව්‍ය ඖෂධයක් මෙන් ඒ ඔවුන් සුවපත් කර ගැනීමේ ශක්තිය ඒ වෛද්‍යවරුන් හා සේවක සේවිකාදීන් සැමට ලැබේවා කියන මෛත්‍රී තරංග අපි එවන්න ඕනෑ. මේ මෛත්‍රී භාවනා චිත්ත තරංග එවමින් සිදු කරන ආශිර්වාද නිසා තම තමාටද සසර වසනාතුරු බක්කුල මහරහතන් වහන්සේට මෙන් නිරෝගි ජීවිත ලබන්නටත් ඒ නිරෝගි ජීවිත පිහිට කරගෙන පාරමී පුරා පරම නිරෝගි සුවය වූ ශාන්ත නිවන් සුව සාක්ෂාත් කර ගන්නට ඒ කාන්තයෙන් හේතු වේවා. කියන අධිෂ්ඨානය පිහිටුවා ගන්නට ඕනෑ. ශාන්තිනායක සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොව පහල වී ලොවට දේශණා කළ ශ්‍රේෂ්ඨ අනුශාසනාවක් සම්පූර්ණ කරමින් අද මේ අවස්ථාවවේ ඉතාමත් වටිනා පිංකමක් මුදුන් පමුණුවා ගත්තා කියලා නැවත නැවතත් සිහිපත් කරමු.

මේ පිංකමේ අංගෝපාංග රාශියක් සිද්ධ වුනා. මාස ගණනාවක් මුළුල්ලේ මෙම ස්ථානයෙහි ශ්‍රමදාන ශීඝ්‍රයෙන් කැඩුම් බිඳුම් ප්‍රතිසංස්කරණය කරන්නට යෙදුනා. ජරාජීර්ණ බවට පත්වී තිබුන සියලුම කටයුතු නිසි සේ නැවත ප්‍රතිසංස්කරණ බවට පමුණුවලා ඉතාමත්ම වටිනා ආරෝග්‍ය ශාලාවක් බවට පමුණුවා ගන්නට මේ දායක මඩුල්ල සමර්ථ වුනා. අපට දැන ගන්න ලැබුනා. සෑම ඉරිදාවකම පැමිණ මේ ස්ථානයෙහි පිලි දැගුම් කරලා විදුලිය සංස්කරණය ජල නල සංස්කරණය අනිකුත් කැඩුම් බිඳුම් වේවා ප්‍රතිසංස්කරණය කරමින් ඉතාමත්ම වටිනා විදිහට මේ පිංකමේ පූර්වභාග ප්‍රතිපත්ති සම්පූර්ණ කර ගන්න යෙදුනා. ඒ වගේම

Sampajanna

ඉදිරියටත් මේ පිංකම නිමාවුනේ නෑ. තව විශාල පිංකමක් බලාපොරොත්තුවන බව සභාපතිතුමාගේ වචනෙන් කියවුනා. ඒ කියන්නේ හැම ආරෝග්‍ය ශාලාවකදීම ප්‍රයෝජනයට ගන්න තිබෙන දුර්ලභ ගණයේ යන්ත්‍ර උපකරණ මේ ස්ථානයට අවශ්‍ය වෙලා තියෙනවා. ඉස්සර කාලෙට වඩා වෛද්‍ය විද්‍යාව ඉහලටම දියුණු වී පවත්නා මේ කාලය තුල ඒ විදිහේ පහසුකම් තියනවනම් අසරණ රෝගීන් වහ වහා සුවපත් කර ගැනීමට වෛද්‍යවරු සමත් වෙනවා. ඒ නිසා රුපියල් දාසය ලක්ෂයක් තරම් විශාල වියදමක් කරන්න බලාපොරොත්තු වන ස්කෑනර් යන්ත්‍රයක් මේ ස්ථානයට පරිත්‍යාග කරන්න දායක මඩුල්ල අරමුදලක් පිහිටුවන්න බලාපොරොත්තු වෙනවා. එය ඉතාමත්ම සීඝ්‍රයෙන් සමුර්ධවෙලා මුදුන් පත් කරගන්නට රත්නත්‍රයේ ආශිර්වාදය දේවාරක්ෂාව ලැබේවා කියා අපි හදපත්ලෙන් ආසිංසනය කරමු. ඒ එක්කම පසුගිය පෙබරවාරි මාසේ විසිවෙන දින කුරුණෑගල මහාරෝග්‍ය ශාලාවේදී අප ප්‍රකාශ කලා එම ස්ථානයට අවශ්‍ය වන හම වෙන්වී ලේටරටක් පරිත්‍යාග කරන්නට බලාපොරොත්තු වෙනවා කියලා. ඇත්තෙන්ම අද මේ දවසේ අගෝස්තු හත්වෙනි දින අපේ පුජනීය මාහිමිපාණන් වහන්සේට පිං පිණිසම එය පරිත්‍යාග කරන්න විශේෂයෙන්ම බලාපොරොත්තු වෙමින් විමසමින් ඊට සංවිධානය කරමින් සිටියා. හරියටම අද දවසේදී කොළඹ උද්‍යාන මාවතේ පින්වත් ප්‍රේමදාස මැණියන්ගේ ජේෂ්ඨ පුත්‍ර පින්වත් උපාලි සෙනරත් මහතාණන් විදේශ රටකට යන අතරේ එතුමාගේ මාර්ගයෙන් වැඩි කලක් යන්න මත්තෙන් ඒ භාණ්ඩය ඒ මාහිමියන් වහන්සේට පිං පිණිස පරිත්‍යාග කරන්න කටයුතු සැලසී තියෙනවා කියන එක සංතෝශයෙන් ප්‍රකාශ කරනවා. විශේෂයෙන් ලංකාවට ගෙන්වනවානම් රුපියල් හත්ලක්ෂ පනස්දාහක් වන මේ භාණ්ඩය අද ඒ උපාලි සෙනරත් මහතාණන් යන ගමනින් නොවරදවාම සාර්ථක කර ගන්නා ලැබේවා කියලා මේ පිංකමේම ආනිශංස හැටියට ප්‍රාර්ථනා කරනවා. ඒ එක්කම තවත් මෙම ස්ථානයෙහි අභිවෘධිය සඳහා කෙරෙන කටයුතු වෙනුවෙන් ඩී.ඇම්.ඕ. දොස්තර මහතාණන්ගේ උපදේශයෙන් හා සෙසු දොස්තරවරුන්ගේ සහයෝගයෙන්, සේවක මඩුල්ලගේ උපකාරයෙන්, දායක මණ්ඩලයේ ආශිර්වාදයෙන් සංඝරත්නයේද ආශිර්වාදයෙන් මෙම ස්ථානයේ ඉතුරු කටයුතු හිතනවාට වඩා දියුණුවෙන් දියුණුවට

පමුණුවා ගන්ට ලැබේවා. පින්වත් කේ.බී, බංඩාරනායක මැතිතුමාණන්ගේ සංවිධායකත්වයෙන් කුරුණෑගලදී සිදුවූ පිංකම මෙන් ලබන වසරේ පෙබරවාරි විසිවෙනි දින නිකවැරටිය ආරෝග්‍ය ශාලාවේදී මේ වගේම පිංකමක් කරන්නට විශේෂයෙන්ම බලාපොරොත්තු වන බවට අද සදහන් කරන්නට ලැබුණා. එයද ඉතාම සාර්ථකව ඉෂ්ඨ සිද්ධ වේවා කියන ආශිංසනය කරනවා.

මේවාගේ රෝගීන්ට පිහිට වෙමින් අසරණයින්ට පිහිට වෙමින් කරන මේ සේවය පාරමී සේවයක්. මෙය රහත් බෝධිය පසේ බෝධිය පමණක් නොවෙයි. ලොව්තුරා අභිසම්බෝධිය දක්වාම සියලු ප්‍රාර්ථනා සඵල කර ගන්න හේතුවන මහා පාරමිතා පිංකමක් බව සිතා සතුටු වන්නට ඕනෑ. බක්කුල මහරහතන් වහන්සේ ඒකාසංඛ්‍යෙයය කල්ප ලක්ෂයක් නිරෝගී ජීවිත විඳිමින් අන්තිමට නිරෝගී භික්ෂූණ්ගෙන් අග තැන්පත් වෙමින් අවුරුදු එකසිය හැටක් ආයුස වලදා පිරිනිවන් පා වලාළේ අර්හත්වයට පත්වුනේ මේ වගේ ගිලානෝපස්ථාන පිංකම් කරලා බව එම චරිතාපදානෙ සඳහන් වෙනවා. අපවත් වී වදාළ මාහිමියන් වහන්සේ ප්‍රධාන අපේ සංඝපිතෘන් වහන්සේලාටත් මෙයට සහභාගි වන සැමටත් නිවන් දක්නා ජාති දක්වා බක්කුල මහ රහතන් වහන්සේට මෙන් නිරෝගී ජීවිත ලබන්නට හා කෙලවර පරම නිරෝගී සුවයවූ අමාමහ නිවන් සුව ලබන්නටද මේ පිංකම ඒකාන්තයෙන් හේතු වේවා කියා අධිෂ්ඨාන තබා ගනිමු. අපවත් වී වදාළ අති පූජණීය පණ්ඩිත ගැටමාන්නේ ශ්‍රී විමලවංශ ස්වාමීන් වහන්සේගේ ශ්‍රී නාමයට ගෞරව උපහාර වහයෙන් සුදානම් කරගන්නා ලද ඒ කෘතවේදී පිංකම සර්වප්‍රකාරයෙන් මුදුන්පත් වුනා. එයට තම තමන්ගේ විශේෂ අධිෂ්ඨානය පිහිටුවාගෙන සමහර විට පරලොව ගිය පින්වතුන්ට පිං පමුණුවන්නට එහෙම නැත්නම් රෝගාබාධිත අයට නිරෝගී සුව පතන්නට, දෙමාපියන්ට පිං ඒවාගේ විශේෂ අධිෂ්ඨාන තබාගෙන මේ පූජා වස්තූන් පරිත්‍යාගයට සූදානම් කරගෙන ආ පින්වතුන් ඒ අරමුණු සිතේ දරාගන්නට ඕනෑ. දැන් මේ පිංකමෙන් ලත් ආනිසංස ධර්ම අපි පූජනීය මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන දෙවියන් සහිත සමස්ථ ලෝකයාට අනුමෝදන් කරවන්නට බලාපොරොත්තු වෙමු.

Sampajanna

වර්ෂයක් මුලුල්ලෙහිම මේ පිංකම ගැන සිත සිතා සංවිධාන වුනා. මාස ගණනාවක් තිස්සේ කය හිත වචන යොදවා මේ කටයුතු වල යෙදුනා ශ්‍රමදාන ශීර්ෂයෙන් විශාල වැඩ කොටසක් සම්පූර්ණ කලා. අවශ්‍යතාවයන් රාශියක් මේ ස්ථානයට සම්පාදනය කලා. ඒ වගේම ඊයේ සන්ධ්‍යාවේ විශේෂ බෝධි පූජාවක් පවත්වා මේ පිංකම ආරම්භ කෙරුනා. උදෑසන ලේ දන්දීමේ පිංකම, ඇස් දන්දීමේ පිංකම, මේ භාණ්ඩ පරිත්‍යාග කිරීමේ පිංකම, මහා සංඝරත්නයට දාන වස්තු පිදීමේ පිංකම, පැමිණියාවූ සැදැහැවත් බෞද්ධ පිංවතුන්ට, ආහාර පාන, භෝජන, සංග්‍රහ කිරීමේ පිංකම, නේවාසික රෝගීන්ට ආහාර පාන සංග්‍රහය, නේවාසික සේවක සේවිකාදී සැම දෙනාට ආහාර පාන සංග්‍රහය ආදී වශයෙන් විශාල පිංකම් පෙළක් මේ පිංකමට සම්බන්ධව සිද්ධ වුනා. මහා සංඝ රත්නය දැකීමෙන් දස්සනානුත්තරිය, බණ ඇසීමෙන් සවනාන්තුතරිය, පිංකම අරමුණු කිරීමෙන් ලාබානුත්තරිය, සිල් සමාදන්වීමෙන් සික්ඛානුත්තරිය, වත් පිළිවෙත් පැවැත්වීමෙන් පරිචරියානුත්තරිය, තුණුරුවන් ගුණ ආවර්ජනා කිරීමෙන් අනුස්සනානුත්තරිය කියන අනුත්තරිය ධර්ම සියල්ලම මේ පිංකම තුළින් සම්පූර්ණ වුනා. පරිත්‍යාගයෙන් දාන පාරමිතාව, සීල සමාදානයෙන් සීල පාරමිතාව නිවන්සුව පැතීමෙන් නෙක්ඛම්ම පාරමිතාව, ආනිසංස මෙනෙහි කිරීමෙන් ප්‍රඥා පාරමිතාව, කායික මානසික උත්සාහය වීර්‍ය්‍ය යෙදීමෙන් වීර්ය පාරමිතාව, සිත පින්න උෂ්ණ බඩගින්න පිපාසාදී සියල්ල ඉවසීමෙන් ශාන්ති පාරමිතාව, සත්‍ය වචනයෙහි පිහිටා පිංකම කිරීමෙන් සත්‍ය පාරමිතාව, කළ අධිෂ්ඨානය එසේම ඉෂ්ඨ කිරීමෙන් අධිෂ්ඨාන පාරමිතාව, පරම මෛත්‍රියෙන් පිංකමේ යෙදීම නිසා මෛත්‍රී පාරමිතාව, කර්ම විපාක මැනවින් තේරුම් ගැනීම නිසා උපේක්ෂා පාරමිතාව කියන, දස පාරමිතාව මේ පිංකම තුළින් සම්පූර්ණ වුනා. කියන එක හිතා මෙනෙහි කරලා සතුටු වන්නට ඕනෑ. මේ පිංකම ගැන සෑම ඉරියව්වක් පාසා මනා සිහියෙන් යෙදුන බැවින් සති පට්ඨාන භෙවත් කායානුපස්සනා, වේදනානුපස්සනා, චිත්තානුපස්සනා, ධම්මානුපස්සනා කියන සතිපට්ඨාන හතරත්, නූපන් අකුසල් නූපදවීමේ වීර්ය, උපන් අකුසල් ගෙවාලීමේ වීර්ය, නූපන් කුසල් ඉපදවීමේ වීර්‍ය්‍ය, උපන්න කුසල් වැඩි දියුණු කිරීමේ වීර්‍ය්‍ය කියන සතර සම්‍යග් ප්‍රධාන වීර්‍ය්‍ය ඡන්ද

ඍද්ධිපාද, චිත්ත ඍද්ධිපාද, විරිය ඍද්ධිපාද, විමංසා ඍද්ධිපාද කියන ඍද්ධිපාද හතරත් සද්ධා ඉන්ද්‍රිය, වීර්ය ඉන්ද්‍රිය, සති ඉන්ද්‍රිය, සමාධි ඉන්ද්‍රිය, ප්‍රඥා ඉන්ද්‍රිය කියන ඉන්ද්‍රිය ධර්ම පහක්. සද්ධා බලය, වීරිය බලය, සති බලය, සමාධි බලය, ප්‍රඥා බලය යන පඤ්ච මහා බලයත්, සති සම්බොජ්ඣඞ්ගය, ධම්ම විචය සම්බොජ්ඣඞ්ගය, විරිය සම්බෝජ්ඣඞ්ගය, පීති සම්බොජ්ඣඞ්ගය, පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය, සමාධි සම්බොජ්ඣඞ්ගය, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගය යන බොජ්ඣඞ්ග හතත්, සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන මාර්ග අටක් යන මේ බෝධිපාක්ෂික ධර්ම තිස්හතම මේ පිංකම තුළින් අපේ සන්තාන වල වැඩුණා කියන එක සංතෝසයෙන් අප සිහිපත් කරන්න ඕනෑ. එසේම ශ්‍රාවක බෝධිඥානය, ප්‍රත්‍යෙක බෝදිඥානය, අභිසම්බෝධිඥානය දක්වාම සියලු බෝධිකාරක ධර්මයන් මුදුන් පමුණුවා ගැනීමේ අසදෘෂ මහා පිංකමක් සම්පූර්ණ කර ගත්තා කියා සිතේ සතුට සමාධිය ඇති කර ගන්නට ඕනෑ.

එසේ ඇති කර ගනිමින් දාන, සීල, භාවනා වශයෙන් සීල, සමාධි, ප්‍රඥා වශයෙන් මාර්ගඞ්ග වශයෙන් බෝධි පාක්ෂික වශයෙන් පාරමී වශයෙන්, මේ සිදු කරගන්නා ලද සකල කුසල සම්භාර ධර්ම, ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සංඝ සභාවේ ප්‍රධාන සභාපති වූද, නාථගන ආරණ්‍යය සේනාධිපතිව වැඩ සිට අපවත් වී වදාළ අති පූජනීය ගැටමාන්නේ ශ්‍රී විමලංසාභිධාන මාහිමිපාණන් වහන්සේට ඒකාන්තයෙන් අත්වේවා. අනුමෝදන් වෙත්වා. මෙපින් බලෙන් නැවත නැවතත් ඒ මාහිමියන් වහන්සේ සුගතියෙන් සුගතියට යමින් සුවසේ පාරමී පෙරුම් පුරමින් මතු අනාගතයේ සුවසේම බෝධිකාරක ධර්මයන් මුදුන් පමුණුවා බෝමුල අරා වැඩ හිඳ ගෙන සපිරිවරා මාර පරාජය කොට උතුම් ලොව්තුරා සම්මා සම්බුද්ධ රාජ්‍යට සුවසේම පත් වෙත්වා කියා අපි ගෞරවයෙන් පිං පමුණුවමු. එසේම අපවත් වී වදාළ අප ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ ප්‍රධානාචාර්ය මීකිරිගල තිස්සරණ වන සේනාසනාධිපති ප්‍රධාන කර්මස්ථානාචාර්ය අති පූජනීය රාජකීය පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාමාභිධාන මහෝපාද්‍යාය



Sampajanna

Sampajanna

මාහිමිපාණන් වහන්සේටද මේ උදාර කුසල සම්භාරය අත් වේවා. අනුමෝදන් වෙත්වා. සුගති සංඛ්‍යාත සම්පත් මුදුන් පත් වී මතු අනාගතයේ දී උතුම් ලොව්තුරා බුදුබවම ලබත්වා කියා අති ගෞරවයෙන් පිං පමුණුවමු. ඒ වගේම ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සසුන් පිලිවෙත් සරුකරමින් සිට අපවත් වී වදාළ සංඝ පීතෘන් වහන්සේලාට ද මේ සියලු කුසල සම්භාරය අත් වේවා. සුගති සංඛ්‍යාත සැප සම්පත් සිද්ධ වේවා. පැතූ උතුම් බෝධි යානාවලින් ශාන්ත අමාමහ නිවනින් සැනසෙත්වා කියා ගෞරවයෙන් පිං පමුණුවමු.

නාථගන ආරන්‍යයේ ආදී කර්තෘතුමාණන් වන ඩිංගිරිබංඩා උපාසකතුමාණන් ඇතුලු යම් තාක් පරලොව ගිය දායක කාරක පිරිසක් වෙත්නම් ඒ සැම දෙනාටමත්, මෙම ආරෝග්‍ය ශාලාවේ ප්‍රතිකාර ලබමින් සිට පරලොව ගිය සියලු රෝගීන්ටත්, අභාවප්‍රාප්ත වෛද්‍යවරු හා සේවක සේවිකාදීන් වෙතොත් ඒ සැම දෙනාටත්, මේ භාණ්ඩ පරිත්‍යාග කළ සියලුම දෙනාගේ පරලොව සැපත් ඥාති බන්ධූන් පිරිසටත්, මේ කුසල සම්භාරය එකසේම අත්වේවා. අනුමෝදන් වෙත්වා. මෙපින් බෙලෙන් ඒ සැම දෙනාට සුගති සංඛ්‍යාත සම්පත් ලබා කෙලවර පැතූ උතුම් බෝධියානවලින් ශානත අමාමහ නිවන් සුව අත්වේවායි කරුණාවෙන් පිං පමුණුවමු. ඊ.සී.ජී. යන්ත්‍රය පරිත්‍යාග කළ කුමාරිහාමි මාතාව කියා හිටියා ස්වාමීනි මම බෝධියත් පතාගෙනයි ඒ පූජාව කලේ. ඒ බෝධිය මට මුදුන් පත් වේවා කියා. එතුමියගේ ඒ ප්‍රාර්ථනාව එසේම ඉෂ්ඨ සිද්ධ වේවායි කියා අපි මෛත්‍රියෙන් ආශිංසනය කරනවා. විශාල වියදමක් කරලා සීත පෙට්ටියක් පරිත්‍යාග කළ පින්වත් ප්‍රේමදාස මාතාව ඉතාම ගෞරවයෙන් මේ පූජාව කළේ. එතුමිය කිව්වා ස්වාමීනි මේ භාණ්ඩ සියල්ලම වුණත් අපි සම්පාදනය කරනවා. නමුත් ඒක බොහෝ දෙනාට අවස්ථාව ලබා දෙන්නටනේ මේ පිංකම සංවිධානය වෙන්නේ. ඒ නිසා කොටසක් භාර ගන්නවා කියලා දැනුම් දෙන්නත් ඉස්සර පත්‍රිකාවක් දැක්ක මාත්‍රයෙන් මේ මාතාව ඇතුලු පිරිස භාණ්ඩ රාශියක් භාර ගත්තා. ඒ මෑණියන්ගේ සති දෙකකට පෙර දයාබර ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය අභාවප්‍රාප්ත වුනා. පින්වත් චිත්‍රා කොස්වත්ත මහත්මිය එතුමියටද මේ කුසලට අත්වෙලා සුගති සංඛ්‍යාත සම්පත් සිද්ධ වී

ශාන්ත අමාමහ නිවන් සුව අත්වේවා කියා පිං පමුණුවන අතර ඒ ප්‍රේමදාස මැණියන්ටත් වැඩි වැඩියෙන් පාරමී පුරා ගැනීමට ශක්තිය බලය නිරෝගී සුවය දීර්ඝායුෂ සහ පිරිවරින්ම ලැබේවා කියා ආශිංසනය කරනවා. ඒ වගේම අපේ පියාණන් වහන්සේට පිං පැමිණවීම පිණිස පින්වත් චන්ද්‍රා ආරියරත්න මහත්මිය වස්තු පරිත්‍යාගයක් කල බව අපට කියා හිටියා. ඒ පියාණන් වහන්සේටත් මේ කුසල් අත්වීමෙන් සුගති සංඛ්‍යාත සම්පත් සිද්ධ වී ශාන්ත අමාමහ නිවන් සුව අත්වේවා කියා මෛත්‍රියෙන් පිං පමුණාවන අතර අපට කෘතවේදීව ඒ පිංකම සිදුකර දෙන චන්ද්‍රා ආරියරත්න මහත්මියටත් සහ පිරිවරින් ආයුරා රෝග්‍ය සම්පත් දීර්ඝායු සම්පත් සැලසී පැතූ බෝධිවලින් ශාන්ත නිවන් සුව සාක්ෂාත් වේවා කියා මෛත්‍රියෙන් සෙත් පතනවා. ඒ වගේම නම් වශයෙන් නොකියා වුනත් මීට සහභාගි වන මේ දෙනෝදහසක් දෙනා පුදුමාකර ගෞරවයකින් මේ පිංකම සිද්ධ කරන්නේ. ඒ සියලු කුසල සම්භාරය සාසනාරක්ෂක ලෝක පාලක, ආත්මාරක්ෂක ඉෂ්ට දේවතා මණ්ඩලය, සාදරයෙන්, සමාදරයෙන්, කරුණාවෙන්, මෛත්‍රියෙන්, චිත්තප්‍රසාදයෙන්, අනුමෝදන් වෙත්වා. සම්බුද්ධ ශාසනයට, ශ්‍රී ලංකාවට, බෞද්ධ ජනතාවට හා මේ ආරෝග්‍ය ශාලාවේ නේවාසික වෛද්‍යවරුන්ට, ඞී.ඇම්.ඕ. දොස්තර මැතිතුමාට චම නොනා මහත්මාවට සහ සේවක සේවික මඩුල්ලටත් මේ මහා පිංකම කරන සැමදෙනාට ධාර්මික දේවාරක්ෂාව සලසා දෙත්වා. පැතූ බෝධිවලින් අමාමහ නිවන් සැපත ලබත්වායි කියා මෛත්‍රියෙන් පිං පමුණාවමු.

ඒ වගේම හිතවත් වූද, මැදහත් වූද, අහිතවත් වූද, සකල සත්වයන්ටද, මෙම වාරියපොල ගම, නගරය ආශ්‍රිතත වූද අවට ගම් නගර ලංකාව දඹදිව මේ සක්වල සියලු සක්වල දසදිසා වාසීවූද, සමස්ත ලෝක සත්වයන්ටත් මේ මහාර්ඝ කුසල සම්භාරය අත්වේවා. සියලුම සත්වයෝ නිදුක් වෙත්වා. නිරෝගී වෙත්වා. සුවපත් වෙත්වා, තෙරුවන් සරණ යෙත්වා, නිවන් මග ගමන් කෙරෙත්වා. ආර්ය සත්‍යා අවබෝධයෙන් ශාන්ත සීතල අමාමහ නිවන් සුව ලබත්වා යි කියා මෛත්‍රියෙන් පිං පමුණාවමු. තුන්සිත පහදවාගෙන බුදු සසුනේ චිර ජීවනය පතමින් විශේෂයෙන් කලගුණ සැලකීමේ ශීර්ෂයෙන් සිදුකර ගන්නා ලද මේ උදාර කුසලානිසංස බලයෙන් හා බුද්ධාදී රත්නත්‍රයානු



Sampajanna

භාව බලයෙනුත්, දිවයරාජ මඩුල්ලේ රැකවනින් හා කල්‍යාණ මිත්‍රයන්ගේද ආශිර්වාද බලයෙනුත්, දිව්‍ය රාජ මඩුල්ලේ රැකවරණින් හා කරන්නට ප්‍රථමයෙන් ආරාධනා කල පින්වත් ධර්ම කුමාර ද සිල්වා ඩී.ඇම්.ඕ. දොස්තර මහත්මාණන් එම නෝනා මහත්මියටත්, ඒ වගේම මෙයට අනුසාසනා කළ පූජ්‍ය හැවැන්පැලැස්සේ චන්දවංස ස්වාමීන් වහන්සේ ප්‍රධාන සහ පිරිසටත්, මේ සඳහා උදේ‍යාගයෙන් ඉදිරිපත් වී කටයුතු සංවිධානය කළ නාථගන ආරන්‍ය සේනාසනස්ථ දායක සභාවේ සභාපති තුමා ලේකම් තුමා, භාණ්ඩාගාරික තුමා ඇතුලු නිලධාරි මඩුල්ලටත්. ස්පෙක්ට්‍රා ආයතනයෙහි නිළධාරි මඩුල්ලටත් අනෙකුත් මීට සහභාගි වු මේ භාණ්ඩ සම්පාදනය කළ සියලුම මහත්වරු, නෝනා මහත්වරු මව්පිය දූ දරු සැමටත්, සිව්පස දාන දායක කාරකාදී සත්පුරුෂ මඩුල්ලටත්, දන්සැල් පැවැත්වූද, නිවි ගාමසියේ සිරිසේන මහත්මාණන්ටත් එම නෝනා මහත්මියත් ඇතුලු සැමටත්, එයට සහයෝගය අනුග්‍රහ සැලසූ සියලු දෙනාට හා චිත්තප්‍රසාදයෙන් වත් පිළිවෙත් පුරා සහභාගි වූ සියලුම දෙනාටත් ඉහතාත්මභාව වශයෙන් සකලාන්තරාය සර්වෝපද්‍රවයන් නිවාරණය වේවා. අසනීපකම් අපල, උපද්‍රව අතුරු ආන්ත්‍රා නවග්‍රහ දෝෂ සතුරු කරදර මාරක බාධක සියල්ල හිරු දුටු අඳුර සේ දුරුවේවා. ආරක්ෂාව සෙත ශාන්තිය සැලසේවා. ශත වර්ෂ කාලයක් දීර්ඝායු ලැබේවා. තබන පියවරක් පාසා රත්නත්‍රය සතු සූවිසි මහා ගුණ බලයෙන් අසීමිත ආරක්ෂාව නිරතුරුවම ලැබේවා. සැමදාම නිදාගන්න ඉස්සර මේ මහා පිංකම සිහිපත් වේවා. නින්දෙන් අවදිවෙන කොට මේ පිංකම සිහිපත් වේවා. මේ පිංකම මාතෘකා කරගෙන තව තවත් පාරමීපුරා ගැනීමට ශක්තිය බලය ධෛර්ය්‍ය වීර්ය්‍ය ආරක්ෂාව ආශිර්වාදය රත්නත්‍රයානු භාවයෙන් ලැබේවා. සැමදා කුසල් සිතින් සැපෙන් නින්ද යාවා. සැපෙන් අවදිවේවා. නපුරු සිහින නොපෙනෙත්වා. දෙවියන්ට ප්‍රිය වේවා. මනුෂ්‍යයන්ට ප්‍රිය වේවා. දෙවියන්ගේ දැහැමි ආරක්ෂාව නිරතුරුවම ලැබේවා. රජුන්ගෙන්, සොරුන්ගෙන්, සතුරන්ගෙන්, ගින්නෙන්, ජලයෙන්, වස විසෙන්, අවි ආයුධයෙන්, මනුෂ්‍ය අමුනුෂ්‍යයන්ගෙන්, තිරිසන්ගත සතුන්ගෙන්වත්, සීතලෙන්, උණුසුමෙන් බඩගින්නෙන්, පිපාසයෙන්, වාතයෙන්, පිතෙන්, සෙමෙන්, මැසිමදුරුවන්ගෙන්, අව්වැසි සුලං, විෂකුරු සර්පාදීන් ගෙන්වත්, රාග දෝෂ මෝහ ආදී

උපක්ලේසයකින්වත්, උප සීලක, උපච්ඡේදක කර්ම විපාක වාරයකින්වත්, බියක් තැති ගැනීමක් අන්තරාවක්, සන්ත්‍රාසයක්, රෝමෝද්ගමනයක් කිසි කලෙක නොමවේවා. කාය, චිත්ත පීඩාදියක් නැතිව් කායික මානසික සැනසීම වැඩි දියුණු වේවා. නිත්‍ය සීල, උපෝසථ සීල සිව් බඹ විහරණ, සතර සංග්‍රහ වස්තු දස පාරමී ධර්ම ආදී බෝසත් ගුණ යන්ගෙන් තව තවත් ජනප්‍රිය වේවා. නොමග යන ජනතාවට නිවන් මග, සුගති මග, දහම් මග, යහමග, පාරමී මාර්ග පහදා දීමේ ශක්තිය බලය ලැබේවා. ලාභාලාභ, යස අයස, නින්දා ප්‍රසංසා, සැප දුක, අටලෝ දහමින් කම්පා නොවන චිත්ත බලය, චිත්ත සෘධිය, චිත්ත වශීභාවය, චිත්ත සමාධිය, චිත්ත ඒකාග්‍රතාව පහළ වේවා. ගුණ නුවනින්, ධන ධාන්‍යයෙන්, යස ඉසුරෙන් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥාවෙන් පෙර පස වැඩෙන, මෝරන, සඳමඩලක් සේ දිනෙන් දින දියුණු වේවා. සිතුමිණ රුවනින් කල්ප වෘක්ෂයකින් භද්‍ර ඝටයකින් මෙන් සිතූ පැතූ සම්‍යග් ප්‍රාර්ථනා සියල්ල වෙසක්, පොසොන්, ඇසල පසළොස්වක පොහොය දවසට උදාවන සොලොස් කලාවෙන් පිරිපුන් පූර්ණ චන්ද්‍රයා සේ පිරී ඉතිරී සශ්‍රීක වී සමෘධි වේවා. ශත වර්ෂාධික කාලයක් සම්බුද්ධ සාසනයේ අපරාජිතව පාරමී පුරා ගන්නට තෙරුවන් පිහිටෙන් ආරක්ෂාව ලැබේවා. සසර ගමනේදී නරකාදි සතර අපායෙන්, ත්‍රිවිධ සත්ත විනාශයෙන් අස්ඨවිධ දුට්ඨක්ෂනයෙන්, පඤ්චවිධ අන්තරාවෙන්, සම්පූර්ණයෙන් සදහටම අත්මිදේවා. සදිව්‍ය ලෝක මනුෂ්‍ය ලෝක සම්පත් ලැබ සැම ආත්ම භාවයකදීම බෝධියක් පතාගෙන පාරමී පුරාගන්නට ජාති ජාතීන් වාසනා වේවා. සිල්වත්, ගුණවත්, නැණවත්, බෝසත් දෙමව්පියන්, සහෝදර සහෝදරාදීන්. දූදරුවන්, නෑදෑ හිත මිතුරන්, සේවක සේවිකාවන් කැටුව සුවසේ පාරමී පුරා ගැනීමටත් බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා අවබෝධ කොට නිවී සැනසී පැමිණ වදාළ ගාම්භීර චතුරාර්යය සත්‍ය ධර්ම අවබෝධයෙන් සිද්ධ වන අජරාමර ශාන්තතප්‍රණීත ලෝකෝත්තර අමෘත මහා නිර්වාන සමාපත්තිය ප්‍රතිලාභය පිණිසත් උදාර පුණ්‍ය සම්භාරය අප සැමදෙනාටම ඒකසේම හේතු වේවා. වාසනා වේවා කියා චිත්තප්‍රීතියෙන් පිං අනුමෝදන් වෙමු. ඥාතීන්ට දෙවියන්ට සියලු සත්වයන්ට හා අපවත් වී වදාළ මාහිමිපාණන් වහන්සේලාට පිං පමුණුවමු.

Sampajanna

ඉධංමේ ඤාතීනං හොතු සුඛිතා හොන්තු ඤාතයෝ///
එත්තා වතාව යම්හෙහි - සම්භදං පුඤ්ඤ සම්පදං
සබ්බෙ දෙවා අනුමොදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා

එත්තාවතාව .................... සබ්බේ භූතා ......................
එත්තාවතාව .................... සබ්බේ භූතා ......................

අකාසට්ඨාච භුම්මට්ඨා - දෙවානාගා මහිද්ධිකා
පුඤ්ඤංතං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සාසනං

ආකාසට්ඨාච ..................... චිරං රක්ඛන්තු දේසනං
ආකාසට්ඨාච ..................... චිරං රක්ඛන්තු මංපරං

ඉමිනා පුඤ්ඤ කම්මේන - මාමෙ බාල සමාගමො
සතං සමාගමො හෝතු - යාව නිබ්බාන පත්තියා///

ඉදම්මේ පුඤ්ඤ කම්මං ආසවක්ඛයා වහං හෝතු
සබ්බ දුක්ඛා පමුච්චතු///

මේ ගාථාව කියලා මාහිමිපාණන් වහන්සේට පිං පමුණුවමු

ඉමිනා අධිකාරෙන - කතෙන සුද්ධ චෙතසං
ඤාණාරම මහාථෙරො - පාපුණාතු සිවං පදං

ඉමිනා අධිකාරෙන - කතෙන සුද්ධ චෙතසං
විමලවංසොමහාථෙරො - පාපුණාතු සිවං පදං

ඉමිනා අධිකාරෙන - කතෙන සුද්ධ චෙතසං
සුමේධොනාම මහා ථෙරො - පාපුණාතු සිවං පදං

විශේෂයෙන්ම අද මේ පිංකමට සහභාගි වීමට නොවැඩියත් මෙම පිංකම අනුමත කොට ආශිර්වාදය ලබා දී ගල්දූව යෝගාශ්‍රම මධ්‍යස්ථානයේ විවේක සුවයෙන් වැඩ වසමින් කරුණාබර සිතින් මේ මොහොතේ අප හා සිටින ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා සමුත්පාදක හා ප්‍රධාන අනුශාසක අති පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංසාභිධාන අස්මදාචාර්යය මාහිමිපාණන් වහන්සේට මේ මහාර්ඝ කුසලානුභාව බලයෙන් සකලාන්තර සර්වෝපද්‍රවයෙන් නිවාරණය වී ශත වර්ෂාධික කාලයක් සුවසේම පාරමී පුරා ගැනීමට ශක්තිය බලය, වාසනාව ලැබේවා, සුවසේම පාරමී පුරා බෝමැඩ අරා වැඩ හිඳ සපිරිවාර මාර පරාජය කොට මතු උතුම් ලොව්තුරා බුදු බවම ලැබෙත්වායි කියා ගෞරවයෙන් පින් අනුමෝදන් කරමින් මේ ගාථාව කියන්න.

ධමෙමන නෙත මතිසුධ මුදා විතෙන<br>
බුද්ධාදි වත්ථු ගත ධම්ම බලෙන සද්ධිං<br>
ථෙරාසභොථ ජිනවසං සථිනද නාථො<br>
දීඝායුකො භවතු සාධු සම්දධ විතෙතා

සබ්බීතියො විවජ්ජන්තු<br>
සබ්බ රොගො විනස්සතු<br>
මාතෙ භවතඨතරයො<br>
සුඛි දීඝායුකො භවෙන<br>
සදා සොත්ථි භවන්තුතේ

භවතු සබ්බ මංගලං ...............<br>
සබ්බ ධම්මානු භාවෙන ..............

භවතු සබ්බ මංගලං ...............<br>
සබ්බ සංඝානු භාවෙන ...............

අභිමාදන සීලිස්ස නිච්චං වද්ධාපචායිනො<br>
චත්තාරො ධම්මා වඩ්ඪංති ආයුවණ්ණෝ සුඛං බලං



Sampajanna

Sampajanna

ආයුරාරෝග්‍ය සම්පත්ති සග්ග සම්පත්ති මේවච
අථෝ නිබ්බාන සම්පත්ති ඉමිනාතේ සමිජ්ඣතු

ඥාතීන්ට දෙවියන්ට පින්පෙත් අනුමෝදන් කරමු.

ඉදංවො ඥාතිනං හොතු
සුඛිතා හොන්තු ඥාතයො ///

එත්තාව තාව අම්මේ හි
සම්පදං පුඤ්ඤ සම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු
සබ්බ සම්පත්ති සිද්ධියා

Sampajanna

Sampajanna